බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**21 S I**

**අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2023**

**උපකාරක ප්‍රශ්න පත්‍ර**

**ආර්ථික විද්‍යාව** | **පත්‍රය - I** | **කාලය පැය දෙකයි**

උපදෙස්:

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා උත්තර පත්‍ර යේ නියමිත පරිදි කතිරයක් (x) යොදා දක්වන්න.

1) ආර්ථික විද්‍යාත්මකව සිතීමේදී පදනම් කරගත යුතු මූලික ආර්ථික මූලධර්මය වන්නේ,

   i. අසීමිත මිනිස් වුවමනා පවතින බවයි
   ii. සමාජයකට අවශ්‍ය ඇතැම් භාණ්ඩ හා සේවා පිරිවැයකින් තොරව ලබාගත හැකි බවයි
   iii. මූලික අවශ්‍යතා උපරිම ලෙස තෘප්තිමත් කර ගැනීම සඳහා සම්පත් උපරිම ලෙස භාවිතා කළ යුතු බවයි
   iv. අසීමිත මිනිස් වුවමනා හමුවේ සම්පත් හිඟ බවයි
   v. අවශ්‍යතාවයන් නිෂ්පාදකයෙකුට නිර්මාණය කළ නොහැකි බව

2) පහත සඳහන් ප්‍රකාශ අතරින් අභිමතානුරූපී ප්‍රකාශයක් ලෙස හඳුනා ගත හැක්කේ කිනම් පිළිතුරද?

   i. මුදල් සැපයුම වැඩි වීම, භාණ්ඩ ඉල්ලුම වැඩි වීමට හේතු වේ.
   ii. පුද්ගලයෙකුගේ අධ්‍යාපන මට්ටම හා ආදායම අතර පවතින්නේ ධන සම්බන්ධතාවකි
   iii. සේවා වියුක්තිය, උද්ධමනයට වඩා උග්‍ර ගැටළුවකි
   iv. භාණ්ඩයක මිල වැඩිවන විට ඉන් මිලට ගනු ලබන ප්‍රමාණය අඩු වේ
   v. රාජ්‍ය වියදම් මගින් උද්ධමනයක් බිහි කෙරේ


3) නිෂ්පාදන සම්පත්වල හිමිකාරිත්වය හා දේපල අයිතිවාසිකම් වල ස්වාභාවය යන නිර්ණායක මත ආර්ථික පද්ධති වර්ග කළ හැකි ආකාරය වන්නේ,

   i. ධනේෂ්වර ආර්ථික පද්ධති, සමාජවාදී ආර්ථික පද්ධති
   ii. වෙළඳපොළ ආර්ථික පද්ධති, විධාන ආර්ථික පද්ධති
   iii. මිශ්‍ර ආර්ථික පද්ධති, සැලසුම් ආර්ථික පද්ධති
   iv. සැලසුම්ගත ආර්ථික පද්ධති, සාම්ප්‍රදායික ආර්ථික පද්ධති
   v. සමාජ වෙළඳපොළ ආර්ථික පද්ධති, සමාජවාදී වෙළඳපොළ ආර්ථික පද්ධති

4) නිෂ්පාදන සාධකයක් ලෙස ප්‍රාග්ධනයේ ලක්ෂණයක් **නොවන්නේ** කුමක්ද?

   i. මිනිසා විසින් නිර්මාණය කරන ලද සාධකයකි
   ii. ස්ථාවර ප්‍රාග්ධනය හා කාරක ප්‍රාග්ධනය වශයෙන් එහි ස්වරූප දෙකකි
   iii. මුදල් යෙදවුමක් වශයෙන් භාවිතා කරමින් ප්‍රාග්ධනය බිහි කළ හැකිය
   iv. ප්‍රාග්ධනය භාවිතා කිරීම වෙනුවෙන් ගෙවනු ලබන මිල පොළියයි
   v. මිනිස් වුවමනා සෘජුවම තෘප්තිමත් කරවීමේ හැකියාවක් ප්‍රාග්ධන භාණ්ඩවලට නොමැත

5) රූප සටහනෙහි දැක්වෙන්නේ කිසියම් රටක නිෂ්පාදන හැකියා වක්‍රයකි. ආවස්ථික පිරිවැයකින් තොර නිමැවුමෙහි වෙනසක් පෙන්නුම් කරනුයේ,




i. Y සිට Z දක්වා
ii. V සිට W දක්වා
iii. W සිට X දක්වා
iv. X සිට W දක්වා
v. U සිට V දක්වා

6) අනුපූරක භාණ්ඩයක මිල වැඩිවන විට,

i. සලකා බලන භාණ්ඩයේ ඉල්ලුම වැඩිවේ
ii. සලකා බලන භාණ්ඩයේ ඉල්ලුම අඩුවේ
iii. සලකා බලන භාණ්ඩයේ ඉල්ලුමට කිසිදු වෙනසක් සිදු නොවේ
iv. සලකා බලන භාණ්ඩය සඳහා ඇති වෙළඳපොළ ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වේ
v. සලකා බලන භාණ්ඩයේ ඉල්ලුමට වන බලපෑම නිෂ්ක්‍රිය වේ

7) පහලට බෑවුම් වන ඉල්ලුම් වක්‍රයක් සහිත සාමාන්‍ය භාණ්ඩයක් සඳහා ආදායම් හා මිල ඉල්ලුම් නම්‍යතාවයන්ගේ පහත සඳහන් කවර සංයෝජනයක් අනුකූලවේද?

| | ආදායම් ඉල්ලුම් නම්‍යතාව | මිල ඉල්ලුම් නම්‍යතාව |
|---|---|---|
| 1 | ඍණ | ධන |
| 2 | ධන | ඍණ |
| 3 | ඍණ | ඍණ |
| 4 | ධන | ධන |
| 5 | ඍණ | ශුන්‍ය |


8) එක්තරා භාණ්ඩයක ඉල්ලුම් සමීකරණය Qd= 400-5p සිට Qd=500-5p දක්වා වෙනස් විය. මෙම වෙනස් වීමට හේතුවන සාධකය කමක්ද?

i. පාරිභෝගික රුචිය පහල යාම
ii. ආදේශන භාණ්ඩ වල මිල පහල යාම
iii. අනුපූරක භාණ්ඩවල මිල පහල යාම
iv. සලකා බලන භාණ්ඩයේ මිල පහල යාම
v. අනුපූරක භාණ්ඩවල මිල ඉහල යාම

9) "කවර බෑවුමකින් යුක්ත සැපයුම් වක්‍රයක වුවද සැපයම් නම්‍යතාව ඒකීය වේ" යන ප්‍රකාශයට අදාල සැපයුම් වක්‍රය නිරූපණය කෙරෙන සැපයුම් සමීකරණය වන්නේ,

i. QS=10P
ii. QS=-10+5P
iii. QS=100 P
iv. QS=20+5P
v. QS=50+5P

10) පහත දැක්වෙන්නේ රජය විසින් නිෂ්පාදකයින් වෙත කරනු ලබන ඌන පූර්ණ ගෙවීම් දැක්වෙන රූප සටහනකි. ඌන පූර්ණ ගෙවීම් කිරීමට රජයට දැරීමට සිදුවන පිරිවැය වන්නේ,




i. රු.2000/= කි
ii. රු.3000/= කි
iii. රු.4000/= කි
iv. රු.5000/= කි
v. රු.6000/= කි


11) එක්තරා භාණ්ඩයකට සාමාන්‍ය ඉල්ලුමක් හා සැපයුමක් පැවති අතර මෙම භාණ්ඩය මත රජය රු.10/=ක ඒකක බද්දක් පනවන ලදි. බද්දෙන් පසු අපේක්ෂා කළ හැකි සිදුවීම කුමක්ද?

i. පාරිභෝගික අතිරික්කය හා නිෂ්පාදක අතිරික්කය පහල යාම
ii. පාරිභෝගික අතිරික්කය හා සමාජ ශුභසාධනය ඉහල යාම
iii. ගැනුම්කරුවන් ගෙවන මිල හා විකුණුම්කරුට ලැබෙන මිල පහල යාම
iv. සමාජ සුබසාධනය හා නිෂ්පාදක අතිරික්කය ඉහලයාම
v. ගැණුම්කරුවන් ගෙවන මිල හා විකුණුම්කරුට ලැබෙන මිල ඉහල යාම

12) X නැමති භාණ්ඩයේ මිල ඉල්ලුම් නම්‍යතාව -0.5 ක් වන අතර ඉල්ලුම් ප්‍රමාණය 30% කින් වැඩි වේ නම්, X භාණ්ඩයේ මිල,

i. 10% න් පහල යා යුතුය
ii. 20% න් ඉහල යා යුතුය
iii. 30% න් පහල යා යුතුය
iv. 60% න් පහල යා යුතුය
v. 120% න් ඉහල යා යුතුය

13) තරඟකාරි වෙළඳපොළක අලෙවි වන භාණ්ඩයකට රජය විසින් නිෂ්පාදනය මත ඒකක බද්දක් පැනවීමෙන් පසු තත්වය පහත රූප සටහනේ දැක්වේ,




බදු පැනවීම නිසා හටගත් අධි බදු බරෙහි වටිනාකම වන්නේ,

i. රු. 10/= කි
ii. රු.20/= කි
iii. රු.140/=කි
iv. රු.160/= කි
v. රු.280/= කි

14) නම්‍ය මිල ඉල්ලුමක් හා අනම්‍ය සැපයුමක් සහිත භාණ්ඩයක් මත රජය ඒකක සහනාධාරයක් සපයයි නම් පහත ඒවායින් වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,

i. මුලු සහනාධාරයම නිෂ්පාදකයාට ලැබේ.
ii. සහනාධාරයෙන් වැඩි කොටසක් නිෂ්පාදකයින්ට ලැබේ
iii. මුලු සහනාධාරයම පාරිභෝගිකයාට ලැබේ
iv. සහනාධාරයෙන් වැඩි කොටසක් පාරිභෝගිකයන්ට ලැබේ
v. සහනාධාරයේ වාසිය නිෂ්පාදකයා හා පාරිභෝගිකයා අතර සම සමව බෙදී යයි

15) ඇඟළුම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යන ව්‍යාපාරිකයෙකුගේ ආරෝපිත පිරිවැයට ඇතුලත් වන්නේ පහත සඳහන් සංරචක අතුරින් කවරක්ද?

i. ආයතනයේ සේවය කරන තත්ව පරීක්ෂකයන්ට ගෙවනු ලබන වැටුප
ii. රෙදි සැපයුම්කරුවන්ට සිදු කරන ගෙවීම්
iii. විදුලි බල මණ්ඩලයට මාසික විදුලි බිල ගෙවීම
iv. නගර සභාවට ගෙවන ලද වරිපනම් බදු
v. ව්‍යාපාරයේ හිමිකරුට විදේශ රැකියාවක නිරත වීම තුලින් උපයාගත හැකි වූ ආදායම


16) එක්තරා නිෂ්පාදන ආයතනයක් ස්ථාවර ප්‍රාග්ධන තොගයක් සමඟ විචල්‍යය යෙදවුම් භාවිතා කරමින් නිෂ්පාදනයේ නිරත වේ. රටේ පවතින උද්ධාමනකාරී තත්වය යටතේ ණය පොලී ගෙවීම් සහ ඉන්ධන ගාස්තු ඉහළ ගියේ නම් ආයතනයේ මුළු ස්ථාවර පිරිවැය, මුළු විචල්‍යය පිරිවැය සහ මුළු පිරිවැය මත ඇති කරන බලපෑම අනුපිළිවෙලින් දැක්වූ විට,

| මුළු ස්ථාවර පිරිවැය (TFC) | මුළු විචල්‍යය පිරිවැය (TVC) | මුළු පිරිවැය (TC) |
|---|---|---|
| අඩු වේ | ස්ථාවර වේ | අඩු වේ |
| අඩු වේ | අඩු වේ | අඩු වේ |
| වැඩි වේ | වැඩි වේ | වැඩි වේ |
| වැඩි වේ | අඩු වේ | අඩු වේ |
| ස්ථාවර වේ | වැඩි වේ | වැඩි වේ |

17) තේ කර්මාන්ත ශාලාවක වැඩ කරන ශ්‍රමිකයන් සංඛ්‍යාව 50 සිට 55 දක්වා ඉහළ නැංවූ අතර ශ්‍රමිකයෙකුට ගෙවන දෛනික වැටුප ද රු.1200/- සිට රු.1500/- ට වැඩි කරන ලදි. ශ්‍රමයේ ආන්තික එලදායිතාව සොයන්න.

i. රු. 300
ii. රු. 1500
iii. රු. 2700
iv. රු. 4500
v. රු. 22,500

18) පහත රූප සටහන මඟින් එක්තරා කර්මාන්තයකට අදාල ශ්‍රම වෙළඳපොළ නිරූපනය වේ.




වෙළඳපොළ සැපයුම් වක්‍රය $S_1$ සිට $S_2$ දක්වා වෙනස් වූ විට සංක්‍රාම ඉපැයීම සහ ආර්ථික බදු කුලිය කෙරෙහි ඇතිවන බලපෑම වන්නේ,

| | සංක්‍රාම ඉපැයීම | ආර්ථික බදු කුලිය |
|---|---|---|
| i | අඩු වේ | වෙනස් නොවේ |
| ii | අඩු වේ | වැඩි වේ |
| iii | අඩු වේ | අඩු වේ |
| iv | වැඩි වේ | අඩු වේ |
| v | වැඩි වේ | වෙනස් නොවේ |

19) "ව්‍යාපාර චක්‍රයක ආයු කාලය" ලෙස හඳුන්වන්නේ,

i. ව්‍යාපාර චක්‍රයක"මුදුනත්" දෙකක් අතර ඇති තිරස් දුරය
ii. ව්‍යාපාර චක්‍රයක"පතුල" දැක්වෙන අවස්ථා දෙකක් අතර ඇති තිරස් දුරය
iii. ව්‍යාපාර චක්‍රයක "සැබෑ නිමැවුම" සහ "විභව නිමැවුම" අතර ඇති සිරස් දුරය
iv. ව්‍යාපාර චක්‍රයක "විභව නිමැවුම" සහ "සැබෑ නිමැවුම" ඡේදනය වන අවස්ථාවක සිරස් දුරය
v. ව්‍යාපාර චක්‍රයක "විභව නිමැවුම" සහ "සැබෑ නිමැවුම" ඡේදනය වන අවස්ථාවක තිරස් දුරය

20) පහත දී ඇති තොරතුරු ඇසුරෙන් ජාතික ගිණුම්කරණයේ දී "නිෂ්පාදන ඉමට" ඇතුළත් කරනු ලබන ක්‍රියාකාරකම වන්නේ,

i. මවක් විසින් තම දරුවන් රැකබලා ගැනීම.
ii. පියෙකු විසින් තම දරුවන් පාසලට ප්‍රවාහනය කිරීම.
iii. නිවසේ අලංකරණය හා පිරිසිදු කිරීම.
iv. පවුලක සිටින වියපත් වූවන් සහ ආබාධිතයන් රැක බලා ගැනීම.
v. තමන්ටම අයිති නිවසකින් ලැබෙන නේවාසික සේවය.

21) පහත දැක්වෙන්නේ කල්පිත ආර්ථිකයක ජාතික ගිණුම් පිළිබඳ තොරතුරු සමූහයකි.

| අයිතමය | රුපියල් මිලියන |
|---|---|
| +දළ නිමැවුමේ වටිනාකම | 1000 |
| +අමු ද්‍රව්‍යය මිල දී ගැනීම | 400 |
| +වැටුප් ගෙවීම | 125 |
| +වෙනත් සේවා | 15 |


මෙම ආර් ථිකයේ එකතු කළ අගය

i. රු.මි. 140
ii. රු.මි. 460
iii. රු.මි. 540
iv. රු.මි. 1000
v. රු.මි. 1140

21) ආර්ථික සම්පත් උපයෝජනය තුළ ඇතුලත් කෙරෙන සංරචක වනුයේ,

i. දළ දේශීය වියදම් හා භාණ්ඩ සේවා වල ආනයන වටිනාකමයි
ii. දළ දේශීය නිෂ්පාදිතය සහ භාණ්ඩ හා සේවාවල ආනයන වටිනාකමයි
iii. සමස්ත පරිභෝජන වියදම සහ භාණ්ඩ හා සේවාවල අපනයන වටිනාකමයි
iv. දළ දේශීය නිෂ්පාදිතය සහ භාණ්ඩ හා සාධක නොවන සේවාවල ආනයන වටිනාකමයි
v. දළ දේශීය වියදම සහ භාණ්ඩ හා සේවාවල අපනයන වටිනාකමයි

22) එක්තරා ආර්ථිකයක පරිභෝජන ශ්‍රිතයට අදාල තොරතුරු පහත රූප සටහනේ දැක්වේ.





මෙම ආර්ථිකයේ ස්වායත්ත පරිභෝජන වියදම රුපියල් මිලියන 1000ක් වේ නම් T ලක්ෂ්‍යයට අදල පෙළඹුණු පාරිභෝජන වියදම කොපමණද?

i. රුපියල් මිලියන 4,800
ii. රුපියල් මිලියන 5,800
iii. රුපියල් මිලියන 9,600
iv. රුපියල් මිලියන10,600
v. රුපියල් මිලියන 14,400

23) කල්පිත ආර් ථිකයක සමතුලිත නිමැවුම රුපියල් බිලියන 3000/- කි. මෙම ආර්ථිකයේ පූර්ණ සේවා නියුක්ති සමතුලිත නිමැවුම රුපියල් බිලියන 4500/- කි. ආන්තික ඉතුරුම් නැමියාව 0.2 ක් වේ නම් පූර්ණ සේවා නියුක්ති සමතුලිතය අත්කර ගැනීම සඳහා වඩාත් යෝග්‍යය ක්‍රියා මාර් ගය වන්නේ,

i. ආණ්ඩුවේ වියදම රුපියල් බිලියන 200 කින් වැඩි කළ යුතුයි.
ii. ආණ්ඩුවේ වියදම රුපියල් බිලියන 250 කින් වැඩි කළ යුතුයි.
iii. ආණ්ඩුවේ සෘජු බදු රුපියල් බිලියන 250 කින් අඩු කළ යුතුය.
iv. ආණ්ඩුවේ වියදම රුපියල් බිලියන 300 කින් වැඩි කළ යුතුයි.
v. ආණ්ඩුවේ සෘජු බදු රුපියල් බිලියන 500 කින් අඩු කළ යුතුය.

24) පහත දැක්වෙන ප්‍රස්තාර සටහනේ $Y_F$ ආර්ථිකයේ පූර්ණ සේවා නියුක්ති නිමැවුම මට්ටම වන අතර $Y_1$ යනු සමතුලිත නිමැවුම් මට්ටමය.




7

මෙම ආර්ථිකයේ "සේවා වියුක්ති පරතරය" පෙන්නුම් කරන්නේ,

i. C සිට D ලක්ෂ්‍යය අතර පවතී
ii. B සිට A ලක්ෂ්‍යය අතර පවතී
iii. $Y_1$ සිට D දක්වා පවතී
iv. $Y_F$ සිට B දක්වා පවතී
v. $Y_F$ - $Y_1$ දක්වා පවතී

26) මුදලක ද්‍රවශීලතාව යන්නෙන් අදහස් කරනුයේ කුමක්ද?

i. මුදල් ලඟ තබා ගැනීමට ඇති කැමැත්ත
ii. කිසියම් වත්කමක් ප්‍රමාදයක් හා අමතර පිරිවැයක් නොමැතිව පහසුවෙන් ගෙවීම් මාධ්‍යක් බවට පෙරළා ගැනීමේ හැකියාව
iii. හරපත් මුදල් බවට පත් කර ගැනීමට ඇති හැකියාව
iv. මූල්‍ය නොවන වත්කම් මූල්‍ය වත්කම් බවට පෙරළා ගැනීමේ හැකියාව
v. සංවිධානාත්මක මූල්‍ය වෙළඳපොළවල් මඟින් මූල්‍ය පත්‍රිකා අලෙවි කිරීම

25) දළ දේශීය නිෂ්පාදිතය ස්ථාවර මිල යටතේ හා පවත්නා මිල යටතේ ගණනය කිරීමේ අතුරු ප්‍රතිඵලයක් ලෙස හට ගන්නා මිල දර්ශකය වන්නේ,

i. කොළඹ පාරිභෝගික මිල දර්ශකය
ii. ජාතික පාරිභෝගික මිල දර්ශකය
iii. නිෂ්පාදක මිල දර්ශකය
iv. ආරෝපිත මිල දර්ශකය
v. නව කොළඹ පාරිභෝගික මිල දර්ශකය

28) උද්ධමනය පාලනය කිරීමේ ප්‍රතිපත්තියක් ලෙස බදු කපා හැරිය යුතු බවත්, එමගින් නිෂ්පාදකයින්ට හා ආයෝජකයන්ට විශාල බලයක් වන බවත් යෝජනා කරන්නේ,

i. සමාහාර ඉල්ලුමේ වර්ධනය සීමා කිරීමටය
ii. සමාහාර සැපයුමේ වර්ධනය වේගවත් කිරීමටය
iii. සෘජු රාජ්‍ය මැදිහත් වීම් වලටය
iv. කාර්යක්ෂම සම්පත් බෙදීයාමේ බාධක ඉවත් කිරීමටය
v. ආර්ථික ස්ථායිතාව ඇති කිරීමටය

29) වාණිජ බැංකු ශේෂ පත්‍රයෙහි මුදල් අයිතම් යටතට ඇතුළත් වේ.

i. එකතු වෙමින් පවත්නා මුදල් ශේෂ
ii. රජයේ සුරැකුම් පත්
iii. භාණ්ඩාගාර බිල්පත්
iv. ණය මුදල්
v. මිලට ගත් හා වට්ටම් කළ බිල්පත්

30) ශ්‍රී ලංකා මහ බැංකුව වර්තමානයේ සිය මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී භාවිතා කරනු ලබන ප්‍රධාන ප්‍රතිපත්ති උපකරණ මොනවාද?

i. බැංකු අනුපාතිකය හා ප්‍රතිපත්ති පොලී අනුපාතිකය
ii. ප්‍රතිපත්ති පොලී අනුපාතිකය හා විවිට වෙළඳපොළ කටයුතු
iii. ණය සීමා කිරීම හා ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා
iv. ශිෂ්ට ප්‍රයෝග හා ප්‍රතිපත්ති පොලී අනුපාතිකය
v. ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා හා විවිට වෙළඳපොළ කටයුතු

31) ව්‍යාපාර චක්‍රයේ දෝලනයන් වැළැක්වීමට යොදා ගැනෙන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හඳුන්වන්නේ කුමන නමකින්ද?

i. ප්‍රතිචක්‍රීය රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය
ii. ස්වයංක්‍රීය ස්ථායිකරණ ප්‍රතිපත්තිය
iii. අභිමතානුසාරී ප්‍රතිපත්තිය
iv. ප්‍රසාරණාත්මක මූල්‍ය ප්‍රතිපත්තිය
v. මධ්‍යස්ත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය


32) ආණ්ඩුව විසින් සපයනු ලබන සේවාවන්ගෙන් කිසිවෙකු ලබන ප්‍රතිලාභ ප්‍රමාණය මත ආණ්ඩුවට බදු ගෙවිය යුතු බව කියවෙන්නේ,

i. සාධාරණත්ව මූලධර්මය මඟිනි
ii. ගෙවීමේ හැකියාව පිළිබඳ මූලධර්මය මඟිනි
iii. ප්‍රතිලාභ මූලධර්මය මඟිනි
iv. තිරස් සාධාරණත්වය මඟිනි
v. සිරස් සාධාරණත්වය මඟිනි

33) කාර්යාත්මක වර්ගීකරණයට අනුව ආණ්ඩුවේ වියදම් වල ආර්ථික සේවා ගණයට ඇතුලත් වන කාර්යක් වනුයේ,

i. ප්‍රවාහනය හා සන්නිවේදනය
ii. සිවිල් පරිපාලනය
iii. ආරක්ෂක කටයුතු
iv. පොදු නීතිය හා ආරක්ෂාව
v. සමාජ සේවා

34) පහත සඳහන් රූප සටහන මඟින් පෙන්වන්නේ,




i. ධන බාහිරතා සහිත පාරිභෝජන ක්‍රියාවලියකි
ii. ඍණ බාහිරතා සහිත පාරිභෝජන ක්‍රියාවලියකි
iii. ධන බාහිරතා සහිත නිෂ්පාදන ක්‍රියාවලියකි
iv. ඍණ බාහිරතා සහිත නිෂ්පාදන ක්‍රියාවලියකි
v. බාහිරතාවයකි

35) ප්‍රතිලාභ ලබන්නන්ගේ පරිභෝජනය සීමා කළ නොහැකි වීමත්, පරිභෝජනයේ තරගකාරිත්වයක් දක්නට ලැබීමත්, මූලික ලක්ෂණ වන්නේ,

i. පොදු සම්පත් වලය
ii. පොදු භාණ්ඩ වලය
iii. සාමූහික භාණ්ඩ වලය
iv. පෞද්ගලික භාණ්ඩ වලය
v. ශුභ සාධන භාණ්ඩ වලය

36) සාපේක්ෂ වාසි මූලධර්මයට අනුව ජාත්‍යන්තර වෙළදාමට ප්‍රවිශ්ඨ වීම මඟින් වාසි ලබාගත හැකි වන්නේ,
   i. නිරපේක්ෂ වාසි ඉහළම අගයන් ගන්නා විටය
   ii. විනිමය අනුපාතික පහළ බසිමින් පවතින විටය
   iii. ආවස්ථික පිරිවැය පහළ අගයක් ගනු ලබන විටය
   iv. ප්‍රවාහන පිරිවැය බොහෝ සෙයින් ශුන්‍ය අගයකයට ආසන්න විටය
   v. වෙළෙඳ ශේෂය අතිරික්තයක් පෙන්නුම් කරන විටය

37) වෙළෙඳ අනුපාතය ඉහල යාහැකි අවස්ථාවක් වන්නේ,
   i. ආනයන මිල දර්ශකයට සාපේක්ෂව අපනයන මිල දර්ශකය ඉහල නගින විටය
   ii. අපනයන මිල දර්ශකයත් ආනයන මිල දර්ශකයත් දෙකම ඉහල යන විටය
   iii. අපනයන මිල දර්ශකය ඉහල යන වේගයට වඩා වැඩි වෙගයකින් ආනයන මිල දර්ශකය ඉහල යන විටය
   iv. ආනයන මිල දර්ශකය ස්ථාවරව තිබියදී අපනයන මිල දර්ශකය පහල යන විටය
   v. අපනයන මිල දර්ශකය ස්ථාවරව තිබියදී ආනයන මිල දර්ශකය ඉහල යන විටය

38) බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාවය සඳහා වූ බහු ආංශික වෙළඳ ගිවිසුම (BIMSTEC නිදහස් වෙළඳ ගිවිසුම) යටතට අයත් රටවල් වන්නේ,
   i. බංගලාදේශය, ඉන්දුනීසියාව, ශ්‍රී ලංකාව, භූතානය, නේපාලය
   ii. බංගලාදේශය, ඉන්දියාව, ශ්‍රී ලංකාව, තායිලන්තය, මියන්මාරය, භූතානය, නේපාලය
   iii. බංගලාදේශය, ඉරාකය, මියන්මාරය, ශ්‍රී ලංකාව, නේපාලය, භූතානය
   iv. බංගලාදේශය, ඉන්දියාව, මැඩගස්කරය, ශ්‍රී ලංකාව, තායිලන්තය, ඊජිප්තුව
   v. බංගලාදේශය, ඉන්දියාව, මාලදිවයින, ශ්‍රී ලංකාව, තායිලන්තය, නේපාලය, භූතානය

39) ගිවිසුම්ගත රටවල් වල රාජ්‍ය මූල්‍ය, මූල්‍ය, සමාජ හා ප්‍රතිචක්‍රීය ප්‍රතිපත්තීන් සියල්ලම සෑම අතින්ම සම මට්ටමකට පත්කොට ක්‍රියාත්මක කිරීම,
   i. පොදු වෙළඳපොළ
   ii. ආර්ථික හවුල
   iii. සමස්ත ආර්ථික අනුකලනය
   iv. සළාක නියම කිරීම
   v. වරණීය වෙළදාම

40) පාවෙන විනිමය අනුපාතිකය නම්‍ය ලෙස පවතින විට ඇතිවන වාසියක් ලෙස සැලකිය හැක්කේ,
   i. දේශීය ආර්ථික කළමනාකරණය සම්බන්ධයෙන් දැඩි විනයක් පැවතීම
   ii. සමපේක්ෂණ ක්‍රියා දිරිමත් කිරීම
   iii. විශාල විදේශ විනිමය සංචිතයක් පවත්වා ගැනීමට අවශ්‍ය වීම
   iv. බාහිර සමතුලිතතාව ආරක්ෂා වීම
   v. ගෙවුම් ශේෂ අසමතුලිතතාවයන්ට ලක්වීම

41) ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විදේශ අරමුදල් සොයා ගැනීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය වෙළඳපොළහි ඩොලර් මිලියන 1000 ක සෛවරීත්ව බැඳුම්කර අලෙවි කිරීම. ගෙවුම් ශේෂ ලේඛනයේ සටහන් වන්නේ,

| හර(-) | බැර(+) |
|---|---|
| 1. මූල්‍ය ගිණුම - කළඹ ආයෝජනය | මූල්‍ය ගිණුම තුල රජයේ මුදල් හා තැන්පතු |
| 2. මූල්‍ය ගිණුම - රජයේ මුදල් හා තැන්පතු | මූල්‍ය ගිණුම තුල කළඹ ආයෝජනය |
| 3. මූල්‍ය ගිණුම - රජයේ මුදල් හා තැන්පතු | මූල්‍ය ගිණුම අනෙකුත් ආයෝජන |
| 4. මූල්‍ය ගිණුම - අනෙකුත් ආයෝජන | ජංගම ගිණුම, ද්විතියක ආදායම් ගිණුම |
| 5. මූල්‍ය ගිණුම - අනෙකුත් ආයෝජන | මූල්‍ය ගිණුම, මුදල් තැන්පතු |

42) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අරමුණු නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ කුමක්ද?

A - ජාත්‍යන්තර මූල්‍ය ප්‍රශ්න වලදී උපදේශක සේවා ලබාදීම

B - සංවර්ධිත රටවල් අතර විනිමය අනුපාතිකයන් ක්‍රමවත් ආකාරයට පවත්වාගෙන යාම

C - ගුණාත්මක තත්වයෙන් යුත් බැංකු හා මූල්‍ය කටයුතු වලට අදාල නීති රීති පවත්වාගෙන යාමට උපදෙස් දීම

D - තාවකාලික ණය පහසුකම් ලබාදීම

E - සාමාජික රටවලට තාක්ෂණික සහාය ලබාදීම

i. A හා D
ii. A හා B
iii. A හා C
iv. B හා D
v. B හා E

43) ආර්ථික සංවර්ධනය යනු,

i. මූර්ත ප්‍රතිශීර්ෂ දළ දේශීය නිශ්පාදිතයේ අඛණ්ඩ වැඩි වීමයි
ii. මිනිස් ජීවිතයන්හි ගුණාත්මක තත්වය ඉහළ නැංවීමේ ක්‍රියාවලියයි
iii. ආදායම් ව්‍යාප්තියේ සාධාරණත්වය ඇති කිරීමයි
iv. ආර්ථික වෘද්ධියත් සමඟ හට ගන්නා පරිවර්තන ක්‍රියාවලියයි
v. ආර්ථික වෘද්ධිය සමඟ විරැකියාව පහළ යාමයි

44) මානව සංවර්ධන දර්ශකය ගණනය කිරීම සඳහා භාවිතා **නොකරන** උපදර්ශකය පහත ඒවායින් කවරක්ද?

i. ළදරු මරණ අනුපාතිකය
ii. පාසැල් අධ්‍යාපනය ලැබූ සාමාන්‍ය වර්ෂ ගණන
iii. ඇමරිකානු ඩොලර් වලින් ප්‍රකාශිත ක්‍රයශක්තිය සාම්‍යය ප්‍රතිශිර්ෂ දළ ජාතික ආදායම
iv. උපතේදී ආයු අපේක්ෂණය
v. පාසල් අධ්‍යාපනය සඳහා ප්‍රවේශවන දරුවෙකු අධ්‍යාපනයේ නිරත වෙතැයි අපේක්ෂිත සාමාන්‍යය වසර ගණන

45) 2022 මානව සංවර්ධන වාර්තාවට අනුව ඉහළම මානව සංවර්ධන දර්ශකයට හිමිකම් කියන රටවල් පිළිවෙලින් ,

i. ස්විට්සර්ලන්තය, නෝර්වේ, අයර්ලන්තය, ජර්මනිය, හොංකොං
ii. නෝර්වේ, ජර්මනිය, හොංකොං, ස්විට්සර්ලන්තය සහ ඕස්ට්‍රේලියාව
iii. නෝර්වේ, හොංකොං, ස්විට්සර්ලන්තය, අයර්ලන්තය සහ ජර්මනිය
iv. ස්විට්සර්ලන්තය, නෝර්වේ, අයිස්ලන්තය, හොංකොං සහ ඕස්ට්‍රේලියාව
v. නෝර්වේ, ස්විට්සර්ලන්තය, අයර්ලන්තය, හොංකොං සහ ජර්මනිය

46) ලෝක බැංකුව ඒ ඒ රටවල ප්‍රතිශීර්ෂ ආදායම පදනම් කරගෙන ලෝකයේ රටවල් වර්ගීකරණය කර ඇත. මෙම වර් ගීකරණයට අනුව පහළ මැදි ආදායම් ලබන රටවල් කාණ්ඩයේ ඒක පුද්ගල දළ ජාතික ආදායම් පරාසය ලෙස 2022 වර්ෂයේ වාර්තා වන්නේ ,

i. ඇමරිකානු ඩොලර් 1 086 – 3895වේ.
ii. ඇමරිකානු ඩොලර් 1086 – 4255 වේ
iii. ඇමරිකානු ඩොලර් 1136 – 4465 වේ.
iv. ඇමරිකානු ඩොලර් 3896 – 12 055 වේ.
v. ඇමරිකානු ඩොලර් 1026 – 12 375 වේ.

47) 2019 සමීක්ෂණ දත්තවලට අනුව ශ්‍රී ලංකාවේ ජනගහන දරිද්‍රතා දර්ශකයේ ආංශික ව්‍යාප්තිය නිවැරදිව දැක්වෙනුයේ පහත සඳහන් කවර දත්ත පෙළකින්ද?

| | නාගරික අංශය | ග්‍රාමීය අංශය | වතු අංශය |
|---|---|---|---|
| (1) | 4.5 | 10.2 | 16.3 |
| (2) | 2.5 | 6.7 | 12.9 |
| (3) | 4.2 | 7.5 | 10.6 |
| (4) | 6.0 | 15.0 | 33.8 |
| (5) | 3.1 | 7.9 | 10.2 |

48) කිසියම් කල්පිත ආර් ථිකයකට අදාළ ජනගහන දත්ත පිළිබඳ තොරතුරු සමූහයක් පහත දැක්වෙ

- ක්‍රියාකාරී වයසේ සිටින ජනගහනය මිලියන 25
- සේවා වියුක්ති ජනගහනය මිලියන 03
- සේවා නියුක්ති ජනගහනය මිලියන 12

ඉහත තොරතුරු වලට අදාලව නිවැරදි අගයන් සහිත වරණය කුමක්ද?

| | ශ්‍රම බලකාය සහභාගීත්ව අනුපාතය | සේවා නියුක්ත අනුපාතය | ශ්‍රම බලකාය |
|---|---|---|---|
| (1) | 30% | 80% | මිලියන 12 |
| (2) | 50% | 20% | මිලියන 15 |
| (3) | 50% | 60% | මිලියන 12 |
| (4) | 60% | 80% | මිලියන 15 |
| (5) | 60% | 20% | මිලියන 15 |

49) ලෝක බැංකු වාර්තාවට අනුව ප්‍රජා විද්‍යාත්මක පාරිතෝෂිකයක් රටකට හිමි වීම සඳහා එරටේ ළමා ජනගහනය හා වයස්ගත ජනගහනය ප්‍රතිශතයක් ලෙස පැවතිය යුතු සීමාවන් නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක්ද?

| | ළමා ජනගහන ප්‍රතිශතය | වයස්ගත ජනගහනය ප්‍රතිශතය |
|---|---|---|
| (1) | 30 ට වඩා අඩුවීම | 15 ට වඩා අඩුවීම |
| (2) | 15 ට වඩා අඩුවීම | 30 ට වඩා අඩුවීම |
| (3) | 40 ට වඩා අඩුවීම | 20 ට වඩා අඩුවීම |
| (4) | 20 ට වඩා අඩුවීම | 40 ට වඩා අඩුවීම |
| (5) | 10 ට වඩා අඩුවීම | 05 ට වඩා අඩුවීම |

50) මැදි ආදායම් උගුලෙන් මිදී ඉහළ ආදායම් කාණ්ඩයම දක්වා පරිවර්තනය වීමට සමත්වී ඇති ආසියානු රටවල් කාණ්ඩය වන්නේ,

i. ශ්‍රී ලංකාව, තායිවානය, බංගලාදේශය හා සිංගප්පූරුවයි
ii. තායිවානය, සිංගප්පූරුව,හොංකොං සහ කොරියාව
iii. ඉන්දියාව, සිංගප්පූරුව, හොංකොං සහ කොරියානු රාජ්‍යයයි
iv. මාලදිවයින,ශ්‍රී ලංකාව, පාකිස්ථානය සහ සිංගප්පූරුවයි
v. තායිවානය, සිංගප්පූරුව, මියන්මාරය කොරියානු ජනරජයයි

| | | |
|---|---|---|
| බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | | 21 S II |
| අධ්‍යාපන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගය - 2023<br>උපකාරක ප්‍රශ්න පත්‍රය | | |
| ආර්ථික විද්‍යාව | පත්‍රය- II | කාලය පැය 03 විනාඩි 10 යි |

උපදෙස් - (අ) උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද (ආ) උප කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද තෝරා ගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

## (අ) උප - කොටස

**(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න)**

1)

i. "හිඟකම යන්න වුවමනාවන් මත තීරණය වන්නකි"ඔබ එකඟ වන්නේද?හේතු දක්වන්න. (ල.04)

ii. නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදාගනු ලබන"ආර්ථික සම්පත්"පැහැදිලි කර, ඒවා වර්ග කොට දක්වන්න. (ල.04)

iii. (අ) - නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර ගොඩනැඟීමේදී යොදාගනු ලබන උපකල්පන 2 ක් දක්වන්න. (ල.02)

(ආ) - පහත සිදුවීම් ඔබ නිෂ්පාදන හැකියා වක්‍රය මගින් පෙන්වන්නේ කෙසේද?

A - එක්සත් ජාතීන්ගේ සංවිධානය ඉරාකයට එරෙහිව ආර්ථික සම්බාධක පැනවීම හේතුවෙන් එරටේ නිෂ්පාදන විභවතාව කාර්යක්ෂමව උපයෝජනය නොවීමේ තත්වය.

B - රටක වැඩකරන වයසේ ජනගහනය ඉහළ යාමක් (ල.02)

iv. මිශ්‍ර ආර්ථික පද්ධති ප්‍රායෝගික ලෝකය තුළ ක්‍රියාත්මක වන ස්වරූප කීයද? එම ආර්ථික පද්ධති වල පවතින වෙනස්කම් මොනවාදැයි සඳන්න. (ල.04)

v. මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීමේදී විවිධ ආර්ථික පද්ධති කාර්යය සාධනය ඉහළනංවා ගැනීමට සාක්ෂාත් කරගත යුතු අභිමතාර්ථයන් කවරේද? (ල.04)

2)

i. (අ) වෙළඳපොළ ඉල්ලුමේ වෙනසක් ඇති වීමට බලපාන සාධක කවරේද? (ල.03)

(ආ)භාණ්ඩයක මිල ප්‍රතිවිපාකය හෙවත් ඉල්ලුම් නීතිය ක්‍රියාත්මක වීමට බලපාන ප්‍රධාන බලවේග කවරේද? කෙටියෙන් දක්වන්න. (ල.02)

ii. පැනක මිල රු.25/= කි.එම මිලේ දී පෑන් සැපයුම් ප්‍රමාණය 300 ක් වන අතර සැපයුම් නම්‍යතාවය 2.5 කි. පෑනක මිල රු. 5/- කින් වැඩි වූයේ නම් එහි දී පෑන් සැපයුම් ප්‍රමාණය කොපමණ වේද? (ල.02)

iii. සෑම ලක්ෂයකදීම නියත නම්‍යතාවයක් ගන්නා සැපයුම් වක්‍රයක් අනිවාර්යයෙන්ම මූල ලක්ෂයෙන් ආරම්භ වනු ඇත.එකඟ වන්නේද? හේතු දක්වන්න. (ල.03)

iv. කිසියම් භාණ්ඩයක් සඳහා පවත්නා වෙළඳපොළ ඉල්ලුම් හා සැපයුම් ශ්‍රිතවලට අදාල සමීකරණ පහත දැක්වේ.

$Qd = 100 - 4P$

$Qs = -30 + 6P$

(අ) සමීකරණ යොදානිමින් සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කොට එම සමතුලිතය ප්‍රස්තාර සටහනක නිවැරදිව පෙන්නුම් කරන්න. (ල.04)

(ආ)වෙළඳපොළ සමතුලිත අවස්ථාවේදී ආර්ථික අතිරික්තය ගණනය කරන්න. (ල.02)

v. ඉහල සිට පහලට බෑවුම් වන ඉල්ලුම් වක්‍රයක ඉල්ලුම් නම්‍යතා සංගුණකය 1ට සමාන වන අවස්ථාවේදී ව්‍යාපාරික අයහාරය උපරිම අගයක් කරා ලඟා වේ. මෙම ප්‍රකාශය රූප සටහනක් යොදාගනිමින් පැහැදිලි කරන්න. (ල.04)

3)

i. නිෂ්පාදන සහනාධාර ලබා දෙමින් රජය වෙළඳපොළට මැදිහත් වීම කාර්යක්ෂම සම්පත් බෙදීයාම කෙරෙහි කෙසේ බලපායි ද? පැහැදිලි කරන්න. (ල.04)

ii. අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩයක් වන බිත්තර සඳහා රජය විසින් උපරිම මිලක් පැනවීමේදී ඇතිවිය හැකි ආර්ථික ප්‍රතිවිපාක කවරේද? (ල.04)

iii. භාණ්ඩයකට බද්දක් පැනවීමේදී බද්දේ බර සම්පූර්ණයෙන්ම ගැණුම්කරුවන් මත පැටවීමට විකුණුම් කරුවන්ට හැකිවේදැයි රූප සටහන් ඇසුරින් විස්තර කරන්න. (ල.04)

iv. තරඟකාරී වෙළඳපොළක අලෙවිකරණ කිසියම් නිෂ්පාදනයක් සඳහා ඇති ඉල්ලුම් හා සැපයුම් වක්‍ර පහත සමීකරණ මඟින් නිරූපණය කෙරේ යැයි සලකන්න.

ඉල්ලුම්; $Qd = 100 - 4P$

සැපයුම්; $Qs = -20 + 8P$

රජය භාණ්ඩ ඒකකයක් මත රු.3/= ක විශේෂිත බද්දක් පනවන්නේ යැයි උපකල්පනය කරමින් බද්ද පැනවීමෙන් පසු නිෂ්පාදකයන්ට ලැබුණු මිල සහ රජයේ බදු අයහාරය ගණනය කරන්න. (ල.04)

v. වර්තමානයේ ගොවියා මුහුණ දෙන ගැටලුවක් ලෙස, තම කෘෂි භෝගයන්ගේ මිල ගණන් ස්ථාවර නොවීම දැක්විය හැකිය. එසේ මිල ගණන් අස්ථායි වීම වැලැක්වීම සඳහා ආණ්ඩුවට ගත හැකි ක්‍රියාමාර්ග කවරේද? (ල.4)

4)

i. කෙටි කාලීන නිෂ්පාදන ශ්‍රිතය සහ දිගුකාලීන නිෂ්පාදන ශ්‍රිතය අතර වෙනස පැහැදිලි කරන්න (ල.04)

ii.

a."යටකළ පිරිවැය" යනුවෙන් කුමක් අදහස් වේද? (ල.02)

b. කෙටි කාලය තුල ආයතනයක් නිෂ්පාදන තීරණ ගැනීමේදී යටකළ පිරිවැය අදාළ කර නොගන්නේ ඇයි ? (ල.02)

iii. පූර්ණ තරගකාරි වෙළඳපොළක කෙටි කාලය තුල කටයුතු කරන ආයතනයක් වසා දැමීමේ තීරණයට එළඹෙන්නේ කුමන අවස්ථාවේදී ද යන්න රූප සටහනක් මඟින් පහදන්න. (ල.04)

iv. දිගු කාලීන සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රය (LRAC) පැතලි "U" අකුරක හැඩය ගනු ලබන්නේ ඇයි දැයි විස්තර කරන්න.

(ල.03)

v. කෙටි කාලයේදී මිල ගනුවෙකු ලෙස කටයුතු කරන නිෂ්පාදන ආයතනයක නිමැවුම් ඒකකය 200 කි. නිමැවුම් ඒකකයක වෙළඳපොළ මිල රු.50 ක් වේ. මෙම නිමැවුම් මට්ටමේදී ඒකකයක සාමාන්‍ය මුළු පිරිවැය (ATC) රු.60 ක්ද සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC) රු.40 ක්ද වේ.

a. ආයතනය ලබන ලාභය හෝ අලාභය ගණනය කරන්න. (ල.02)

b. ආයතනයේ මුළු ස්ථාවර පිරිවැය කොපමණද? (ල.01)

c. මෙම ආයතනය තවදුරටත් වෙළඳපොළ තුල රැඳී සිටිය යුතුද නැද්ද යන්න පිළිබඳව ආර්ථික විද්‍යානුකූලව විමසන්න. (ල.02)

5)

i. සරල ආර්ථිකයක වෘත්තාකාර ප්‍රවාහ සටහනේ ක්‍රියාකාරිත්වය රූප සටහනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල.05)

ii. "සත්‍ය සුනිශ්චිත පරිභෝජන වියදම" යනුවෙන් කුමක් අදහස් වේද? (ල.02)

iii. නිමැවුම් ප්‍රවේශය, ආදායම් ප්‍රවේශය සහ වියදම් ප්‍රවේශය යනුවෙන් විකල්ප ප්‍රවේශයන් පැවතියද රටක දළ දේශීය නිෂ්පාදිතය සඳහා ලැබෙන්නේ එකම අගයකි. පහත දැක්වෙන දත්ත ඇසුරෙන් දළ දේශීය නිෂ්පාදිතය ගණනය කර ඒ බව සනාථ කරන්න. (ල.06)

| | රුපියල් මිලියන |
|---|---|
| ❖ කෘෂිකාර්මික අංශයේ එකතු කළ අගය | 5000 |
| ❖ සේවක ආදායම | 9000 |
| ❖ ශුද්ධ අපනයන | 1300 |
| ❖ පෞද්ගලික පරිභෝජනය | 8000 |
| ❖ නිෂ්පාදනය මත ශුද්ධ බදු | 1000 |
| ❖ නිෂ්පාදිතය මත ශුද්ධ බදු | 300 |
| ❖ කාර්මික අංශයේ එකතු කළ අගය | 3000 |
| ❖ දළ මෙහෙයුම් අතිරික්තය | 5000 |
| ❖ දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | 1500 |
| ❖ මිශ්‍ර ආදායම් | 3000 |
| ❖ රජයේ පරිභෝජනය | 7500 |
| ❖ සේවා අංශයේ එකතු කළ අගය | 10,000 |

iv. විවෘත ආර්ථිකයක ජාතික ආදායමේ සමතුලිතය සඳහා අවශ්‍ය කොන්දේසි කවරේද? (ල.02)

v. කල්පිත ආර්ථිකයක පරිභෝජන ශ්‍රිතය C= 600+0.8Yවේ. ආයෝජනය (I) රුපියල් මිලියන 200 ක් වේ.

a. සමතුලිත නිමැවුම සොයන්න. (ල.02)

b. සමතුලිතයේ දී පරිභෝජන වියදම කීයද? (ල.01)

c. ඉතුරුම් ශුන්‍ය වන ආදායම කීයද? (ල.02)

**(ආ) උප - කොටස**

**(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න)**

6)

i. වත්කමක් වශයෙන් සලකන සියලු දෑ මුදල් ලෙස සැලකිය නොහැකි වන්නේ මුදල් වෙනත් වත්කම් වලින් වෙන්කර හදුනාගත හැකි සුවිශේෂී ලක්ෂණ නිසාය. හොඳ මුදලක ලක්ෂණ දක්වන්න. (ල.04)

ii. "වාණිජ බැංකුවක් සිය වත්කම් ව්‍යුහය කළමනාකරණය කළ යුත්තේ එකිනෙකට ගැටෙනසුළු අරමුණු දෙකක් තුලනය වන ආකාරයටය" වාණිජ බැංකු ශේෂ පත්‍රයේ වත්කම් ඇසුරින් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ල.05)

iii. පහත සඳහන් දෑ කෙරෙහි උද්ධමනය බලපානනේ කෙසේද?

a. ආනයනය

b. විනිමය අනුපාතය

c. ගෙවුම් ශේෂය

d. සේවා වියුක්තිය (ල.04)

iv. වාණිජ බැංකු පද්ධතියක ඒකාබද්ධ ශේෂ පත්‍රය පහත දැක්වේ.

| වත්කම් | | වගකීම් | |
|---|---|---|---|
| තැන්පතු | 500 | මුදල් සංචිතය | 70 |
| | | භාණ්ඩාගාර බිල්පත් | 130 |
| | | ණය හා අත්තිකාරම් | 300 |
| | 500 | | 500 |

(අ) 20% ක සංචිත අවශ්‍යතාවක් පවතී. බැංකු පද්ධතිය තුල සියලු ගැලපීම් කිරීමෙන් පසු නව ඒකාබද්ධ ශේෂ පත්‍රය ගොඩනගන්න. (ල.03)

(ආ) බැංකු පද්ධතියට ණය ලබාදීමේ හැකියාවක් පවතීද? එසේ නම් ඒ කොපමණ මුදලක්ද? (ල.02)

(ඉ) බහුවිධ තැන්පතු සංකෝචනය යන්න පැහැදිලි කරන්න. (ල.02)

7)

i. ලෝකයේ ශුද්ධමය වශයෙන් ධනවාදී හෝ සමාජවාදී අර්ථක්‍රම ක්‍රියාත්මක කිරීම ප්‍රායෝගික වශයෙන් අපහසුය. නූතන වෙළඳපොළ ආර්ථික පද්ධති ක්‍රියාත්මක වන්නේ ආණ්ඩුවක් මැදිහත් වෙමිනි.නූතන වෙළඳපොළ ආර්ථික පද්ධතියක ආණ්ඩුවක් විසින් ඉටුකරනු ලබන බහුවිධ කාර්යභාර්ය කවරේද? (ල.04)

ii. "බදු අයකිරීමේ මූලිකම අරමුණ වන්නේ සම්පත් ඒකරාශී කිරීම වේ"බදු අය කිරීම තුළින් රජයන් අපේක්ෂා කරනු ලබන වෙනත් අරමුණු මොනවාද ? (ල.04)

iii. දියුණු රටවලට සාපේක්ෂව බැලීමේදී ශ්‍රී ලංකාවේ බදු අනුකූලතාවය ඉතාම පහළ මට්ටමක පවතී.මෑත කාලීනව ශ්‍රී ලංකාවේ විශාල ලෙස බදු වැඩි කරමින් සිටියද බදු ආදායම සාධනීය මටටමකින් ඉහල නංවා ගැනීමට ඇති හැකියාව අඩුය.

ශ්‍රී ලංකාවේ සාපේක්ෂ වශයෙන් පහළ බදු අනුකූලතාවයක් පැවතීමට බලපාන කරුණු හා බදු ආදායම ඉහල නංවා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග සඳහන් කරන්න. (ල.04)

iv. "ශ්‍රී ලංකාවේ වර්තමාන රාජ්‍ය ණය තත්වය සැනසිලිදායක තත්වයක් නොවේ" රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයක් ඇති කර ගනිමින් ප්‍රාථමික ශේෂය අතිරික්තයක් බවට පෙරලා ගැනීමට අසමත් වුවහොත්, ණය ආපසු ගෙවීමේ අවදානම්කාරී තත්වය ඉහල යනු ඇත. රාජ්‍ය ණය තිරසාර භාවය යනු කුමක්ද? එය ඇගයීම සඳහා යොදා ගන්නා ප්‍රධාන දර්ශකයේ මෑතකාලීන වෙනස්කම් දක්වන්න (ල.04)

v. සියලු පාර්ශවයන් ස්වාර්ථය උදෙසා කටයුතු කිරීම වෙළඳපොළ ආර්ථිකයක ප්‍රධාන ලක්ෂණයක් වේ. ඒ නිසාවෙන්ම ඔවුන් අනෙකාගේ යහපත කෙරෙහි දක්වන සැලකිල්ල ප්‍රමාණවත් නොවේ.

වර්තමානයේ මිනිසුන්ගේ බොහෝ පරිභෝජන ක්‍රියාවන් හේතුකොට ගෙන සමාජයීය වශයෙන් ඇති කරන ප්‍රශස්ත මට්ටම ඉතාම පහළ තත්වයක පවතී. මෙම තත්වය නිසා වෙළඳපොළ ආර්ථිකයන් තුළ සම්පත් බෙදීයාම ආකාර්යක්ෂම වන ආකාරය රූප සටහනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල.04)

8)

i. (අ)සාපේක්ෂ පිරිවැය න්‍යාය පදනම් කරගනු ලැබූ උපකල්පන මොනවාද? (ල.02)

ii. (ආ)සාපේක්ෂ වාසිය ගතික සංකල්පයකි. ඒවා කාලයත් සමඟ වෙනස්වීම් වලට භාජනය වේ.එලෙස කාලයත් සමඟ සාපේක්ෂ වාසි වෙනස්වීම කෙරෙහි බලපාන ප්‍රධාන සාධක නම් කරන්න. (ල.03)

iii. පසුගිය දශක කිහිපය තුල ආනයනය සඳහා වැඩිබර තැබීමක් හේතුකොට ගෙන ගෙවුම් ශේෂය දැඩි අර්බුධයකට ලක්ව ඇති බව ආර්ථික විශේෂඥයින්ගේ මතයයි. ඊට බලපා ඇත්තේ නිදහස් වෙළඳාම බවත් ඒ සඳහා ක්‍රියාමාර්ග ගැනීමෙන් යම්කිසි සහනයක් ලබා ගත හැකි බවත් විශ්වාස කරයි.ඒ අනුව වෙළෙඳ ආරක්ෂණවාදයට පක්ෂව ඉදිරිපත් කොට ඇති ප්‍රධාන ආර්ථික තර්ක සඳහන් කරන්න. (ල.05)

iv. ගෙවුම් ශේෂ ලේඛනයේ සමස්ත ගිණුම් හිඟයක් දිගුකාලීනව පවතී නම්, ඊට පිළියම් ලෙස යොදාගත හැකි ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග කවරේද? (ල.04)

v. පහත සඳහන් ගණුදෙනු ද්විත්ව තීරු ක්‍රමය යටතේ ගෙවුම් ශේෂ ලේඛනයට ඇතුලත් කරන්න. (ල.06)

a. ශ්‍රී ලාංකික සමාගමක් මිලියන 2000 ක වටිනාකමකින් යුත් ජංගම දුරකථන චීන සමාගමක් වෙතින් ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබීම

b. ශ්‍රී ලංකාව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලබාගත් ණය වෙනුවෙන් වාර්ෂිකව ඩොලර් මිලියන 500ක් ගෙවීම

c. ශ්‍රී ලංකාවේ ආණ්ඩුව ජාත්‍යන්තර මූල්‍ය වෙළඳපොළහි ඩොලර් මිලියන 500 ස්වෛරී බැඳුම් කර අලෙවි කර ඇත. ඒ වෙනුවෙන් ඩොලර් මිලියන 10 ක පොලී ගෙවීම.

d. ශ්‍රී ලංකාවේ පෞද්ගලික ව්‍යාපාර සමාගමක් ජාත්‍යන්තර මූල්‍ය ආයතනයකින් ඩොලර් මිලියන 25 ක ණය ලබා ගැනීම.

e. මැදපෙරදිග සේවය කරන ශ්‍රී ලාංකිකයෙක් තම ඥාතීන් වෙත එවනු ලබන ඩොලර් මිලියන 5 ප්‍රේෂණ

f. ශ්‍රී ලාංකික සමාගමක් සතුව මාලදිවයිනේ ඇති සංචාරක හෝටලයකින් ලාභාංශ වශයෙන් ඩොලර් මිලියන 800 ක් ලැබීම

9)

i. ආර්ථික වර්ධනයත් සමඟ"කෘෂි අංශයට" සාපේක්ෂව"සේවා අංශය" ඉහල වර්ධනයක් අත්කරගනු ලබන්නේ ඇයි? (ල.04)

ii. 2022 වර්ෂය ලංකාවේ අඩුම ආර්ථික වර්ධන වේගය -7.8% අගයක් වාර්තා කරන ලදි.මෙසේ ආර්ථික වෘද්ධිය අඩාලවීමට බලපෑ සාධක මොනවාද? (ල.04)

iii. මානව සංවර්ධනය අර්ථ දක්වන්න. මානව සංවර්ධනයේ යහපත් ලක්ෂණ මොනවාද? (ල.04)

iv. මානව සංවර්ධනය වඩා පරිපූර්ණ ලෙස විග්‍රහ කිරීම සඳහා කුමන ක්ෂේත්‍රයක් කෙරෙහි සැලකිල්ලට ගත යුතුද? (ල.04)

v. ශ්‍රී ලංකාවෙ දරිද්‍රතාවය කෙරෙහි බලපාන සාධක ප්‍රධාන ශිර්ෂ යටතේ පැහැදිලි කරන්න. (ල.04)

10)

i. ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රාග්ධන හිඟයට වඩාත්ම සුදුසු මූලාශ්‍රය වන්නේ විදේශ ආයෝජන ආකර්ශනය කර ගැනීම වේ. ශ්‍රී ලංකාව වර්තමානයේ මුහුණදෙන අභියෝග දක්වමින් ඉහත ප්‍රකාශයේ වලංගුභාවය පරීක්ෂා කරන්න. (ල.05)

ii. ස්ථාවර ජාතික සංවර්ධන ප්‍රතිපත්තියක අවශ්‍යතාවය පැහැදිලි කරන්න. (ල.05)

iii. නිදහසින් පසු ශ්‍රී ලංකා ආර්ථිකයේ ගමන් මග ආර්ථික ලක්ෂණ වලට අනුව අවධි 05 කි.එම අවධි 05 දක්වන්න. (ල.05)

iv. රාජ්‍ය මූල්‍ය අවකාශය යන්නෙන් කුමක් අදහස්වේද?ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය අවකාශය අහිමිවීම ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි ඇතිකරන අයහපත් බලපෑම විස්තර කරන්න. (ල.05)

| බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 21 S I |
|---|---|

**අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2023**

**උත්තර පත්‍රය**

| ආර්ථික විද්‍යාව | පත්‍රය - I | කාලය පැය දෙකයි |
|---|---|---|

| ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|
| 1 | iv |
| 2 | iii |
| 3 | i |
| 4 | iii |
| 5 | v |
| 6 | ii |
| 7 | i |
| 8 | iii |
| 9 | i |
| 10 | iv |
| 11 | i |
| 12 | v |
| 13 | v |
| 14 | ii |
| 15 | v |
| 16 | iii |
| 17 | iv |
| 18 | ii |
| 19 | i |
| 20 | v |
| 21 | ii |
| 22 | v |
| 23 | iii |
| 24 | iv |
| 25 | v |

| ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|
| 26 | ii |
| 27 | iv |
| 28 | ii |
| 29 | i |
| 30 | i |
| 31 | i |
| 32 | iii |
| 33 | i |
| 34 | i |
| 35 | i |
| 36 | iii |
| 37 | i |
| 38 | ii |
| 39 | iii |
| 40 | ii |
| 41 | ii |
| 42 | ii |
| 43 | iv |
| 44 | i |
| 45 | iv |
| 46 | iii |
| 47 | iv |
| 48 | iv |
| 49 | i |
| 50 | ii |

| බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 21 S II |
|---|---|

අධ්‍යාපන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගය - 2023

උත්තර පත්‍රය

| ආර්ථික විද්‍යාව | පත්‍රය- II | කාලය පැය 03 විනාඩි 10 යි |
|---|---|---|

1)

i. එකඟ වේ
හිඟකම යන්නෙන් අදහස් කරන්නේ මිනිස් වුවමනා සපුරා ගැනීම සඳහා සමාජය සතු සම්පත් සම්භාරය ප්‍රමාණවත් නොවීමයි.මෙය සෑම සමාජයකටම පොදු මූලික ආර්ථික ගැටලුවකි.(ල.01)

මෙම ප්‍රශ්නය පැන නගින්නේ යම් දෙන ලද අවස්ථාවක මිනිස් වුවමනා අසීමිත වීමත් එකී වුවමනා සපුරා ගැනීමට භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සඳහා යොදාගත හැකි සම්පත් ප්‍රමාණය සීමා සහිත වීමත් නිසාය (ල.01)
එබැවින් හිඟකම පිළිබඳ නිර්වචනයේදී වඩාත් තීරණාත්මක වනුයේ වුවමනා යන්නයි. ඊට හේතුව දෙන ලද සම්පත් සම්භාරය මගින් හිඟකමක් ඇති කරනු ලැබේද නැද්ද යන්න තීරණය වනුයේ එමගින් ඇති කරනු ලබන වුවමනා ප්‍රමාණය මතය (ල.02)

ii. සමාජයේ අසීමිත වුවමනාවන්ට සාපේක්ෂව සැපයුම සීමිත හෝ හිඟකමක් හෝ සහිත නිෂ්පාදන සම්පත් ආර්ථික සම්පත් වශයෙන් හඳුන්වනු ලැබේ. (ල.01)

ආර්ථික සම්පත්වල අවස්ථික පිරිවැය ධන අගයක් ගනී. යම් එක් කටයුත්තකට එම සම්පත් යොදා ගැනීමට ඇති හැකියාව අත්හැර දැමීමට සිදුවනු ඇත. (ල.01)

ආර්ථික සම්පත් ප්‍රධාන කාණ්ඩ 4 කට වර්ග කළ හැක
- භූමිය
- ශ්‍රමය
- ප්‍රාග්ධනය
- ව්‍යවසාය (ල.02)

නිෂ්පාදන සම්පත් වර්ගීකරණයට විකල්ප පිළිතුරු
- දේපළ සම්පත් - ස්වභාවික සම්පත්, ප්‍රාග්ධනය
- මානව සම්පත්- ශ්‍රමය, ව්‍යවසායකත්වය


(දේපළ හා මානව සම්පත් ලෙස පමණක් නම්කර ඇත්නම් ල.01)

iii. (අ)
- සලකා බලන කාලච්ඡේදය තුළ ආර්ථිකය සතු සම්පත් සම්භාරයේ ස්ථාවරව පවතින බව
- පූර්ණ සේවා නියුක්තිය හා පූර්ණ නිෂ්පාදනය සාක්ෂාත් වන ලෙස සියළුම සම්පත් භාවිතා කරන බව
- අදාළ කාලච්ඡේදය තුළ තාක්ෂණය නොවෙනස්ව පවතින බව
- ආර්ථිකය සතු සීමිත සම්පත් යොදා ගනිමින් භාණ්ඩ වර්ග දෙකක් පමණක් නිෂ්පාදනය කරන බව

( ඕනෑම කරුණු දෙකකට ලකුණු 02)


(ආ)

A




(ල.02)

B




iv.

| සමාජීය වෙළඳපොල ආර්ථිකය | සමාජවාදී වෙළඳපළ ආර්ථිකය |
|---|---|
| වෙළඳපොළ ආර්ථික පද්ධතියක් තුළ සමාජ සාධාරණය ඇති කිරීම සඳහා රජය මැදිහත් වන ආර්ථිකය සමාජය වෙළඳපළ ආර්ථිකයයි | මූලික වශයෙන් සමාජවාදී දර්ශනයක් මත මෙහෙයවන කිසියම් දුරකට වෙළෙඳපොළ බලවේගවලට ක්‍රියාත්මක වීමට ඉඩ සලසා ඇති ආර්ථිකය සමාජවාදී ආර්ථිකයයි |
| නිෂ්පාදන සම්පත් පෞද්ගලික අංශය සතුවේ | නිෂ්පාදන සම්පත් රජය සතුවේ |
| නිෂ්පාදන සම්පත් භාවිතය පිළිබඳ විශාල බලපෑමක් රජය කරයි | භාවිතය පිළිබඳ තීරණ ගැනීම පෞද්ගලික අංශය සතුය |

(ඕනෑම වෙනස්කම් දෙකකට ල.04)

v.

- පූර්ණ සේවා නියුක්තිය
- ආර්ථික කාර්යක්ෂමතාව
- ආර්ථික වෘද්ධිය
- මිල ස්ථායිතාව
- සාධාරණ ආදායම් ව්‍යාප්තිය
- බාහිර ස්ථායීතාව
- පාරිසරගුණාත්මක භාවය
- ආර්ථික නිදහස

(ඕනෑම කරුණු හතරකට ල.04)

2)

i. (අ)

- පාරිභෝගික ආදායම
- සම්බාධිත භාණ්ඩ(ආදේශනා අනුපූරක භාණ්ඩ )මිල
- අනාගත අපේක්ෂා
- පාරිභෝගික රුචිකත්වය
- ගැනුම්කරුවන් සංඛ්‍යාව
- සමාජයීය, දේශපාලනික, පාරිසරික සාධක

(ඕනෑම කරුණු තුනකට ල.03/මිල ලියා ඇත්නම් 0)

(ආ) යම් නිශ්චිත කාලච්ඡේදයක් තුළ අනෙකුත් කරුණු නොවෙනස්ව තිබියදී කිසියම් භාණ්ඩයක මිල වෙනස්වීම නිසා ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය කෙරෙහි ති කෙරෙන බලපෑම මිල ප්‍රතිවිපාකය වශයෙන් හඳුන්වයි .(ල. 01)

මෙම ප්‍රතිවිපාකය ක්‍රියාත්මක වන්නේ ප්‍රධාන බලවේග දෙකක් ඔස්සේය.

1.ආදේශන ප්‍රතිවිපාකය

2. ආදායම් ප්‍රතිවිපාකය (ල.01)

ii. (අ) පැන් සැපයුම් ප්‍රමාණය සෙවීම, ($\Delta P=5$ , $Es=2.5$ , $P=25$, $Q=300$) (ල.01)

$$Es = \frac{\Delta Q}{\Delta P} \times \frac{P}{Q}$$

$$2.5 = \frac{\Delta Q}{5} \times \frac{25}{300}$$

$$\Delta Q = 150$$

මිල රු.30 දී


$Q + \Delta Q = 300 + 150 = 450$ (ල.01)

සැපයුම් ප්‍රමාණය = ඒකක450

(ආ) එකඟ නොවේ


මූලයෙන් පටන් ගන්නා සරල රේඛීය සැපයුම් වක්‍රය සෑම ලක්ෂයකදීම නියත නම්‍යතාවයක් ගන්නා සැපයුම් වක්‍රයන් ගෙන් එක් අවස්ථාවක් පමණි. ඊට අමතරව පහත දැක්වෙන අවස්ථාවලදී සැපයුම් වක්‍රයේ නම්‍යතාව සෑම ලක්ෂයකදීම නියත අගයක් ගනී. (ල.01)

1. පූර්ණ අනම්‍ය සැපයුම්




මෙහි සෑම ලක්ෂයකම නම්‍යතාවය 0 වේ (ල.01)

2. පූර්ණ නම්‍ය සැපයුම්




මෙහි සෑම ලක්ෂයකම නම්‍යතාවය ∝ අගයක් වේ (ල.01)

iii. (අ)

$Qd = Qs$

$100 - 4p = 30 + 6p$

$130 = 10p$


$13 = p$

$Qd = 100 - 4(13)$

$Qd = 48$ ඒකක

සමතුලිත මිල 13/-

සමතුලිත ප්‍රමාණය ඒකක 48 (ල.01)




S වක්‍රය -30 න් ආරම්භ කල යුතුය
නිවැරදි ප්‍රස්තාරයට (ල.01)

(ආ) සමතුලිතයේදී පරිභෝගික අතිරික්තය

$$\frac{(\text{උපරිම ඉ.මිල- සමතුලිත මිල})^* \text{ සමතුලිත ප්‍රමාණය}}{2}$$

$$\frac{(25-13)*48}{2} = \frac{576}{2} = 288 \quad (\text{ල}.01)$$

සමතුලිතයේදී නිෂ්පාදන අතිරික්තය

$$\frac{(\text{සමතුලිත මිල - අවම සැපයුම් මිල}) * \text{ සමතුලිත ප්‍රමාණය}}{2}$$


$$\frac{(13-5)*48}{2} = \frac{384}{2} = 192 \quad (\text{ල}.01)$$

ආර්ථික අතිරික්තය = පාරිභෝගික අතිරික්තය + නිෂ්පාදන අතිරික්තය
=288+192
= 480 (ල.01)

විකල්ප ලෙස

$$\frac{(25-5)*48}{2} = 480 \quad (\text{ල}.03)$$

iv. ඒකීය නම්‍යා අවස්ථාවේ දී මිල කොතරම් වෙනස් වුවද ව්‍යාපාරික අයභාරයේ වෙනසක් සිදු නොවේ. ඒ අනුව මුළු අයභාරය උපරිම අගයක් කරා ළඟා වන්නේ ඉල්ලුම ඒකීය නම්‍යා අවස්ථාවේදීය (ල.02)




නිවැරදි ප්‍රස්තාරයට (ල.03)

3)

i.

නිෂ්පාදන සහනාධාරයක් යනු නිෂ්පාදකයන් දිරිගැන්වීමට රජය ලබාදෙන මූල්‍යමය හෝ ද්‍රව්‍යමය ආධාරයයි (ල.01)

සහනාධාරයෙන් තොර නිදහස් වෙළඳපොළ ඇතිවන සමතුලිතය කාර්යක්ෂම නිෂ්පාදන මට්ටමක් බිහිකරයි . ආන්තික ප්‍රතිලාභ ආන්තික පිරිවැය සමාන වේ. (ල.01)

සහනාධාර මගින් වෙළඳපොළ ක්‍රියාත්මක වූ සමතුලිතයට බාධා ඇතිවේ. එනම් නිෂ්පාදකයන් දිරිගැන්වී අතිරික්ත නිෂ්පාදනයක් බිහිවේ. එසේ වැඩිපුර නිපදවන ඒකකයන්හි ආර්ථික ප්‍රතිලාභ ප්‍රමාණය එම නිෂ්පාදනය බිහි කිරීමේ දී හටගන්නා ආන්තික පිරිවැයට වඩා අඩුය. එබැවින් වෙළඳපළ අකාර්යක්ෂමතා පිළිබිඹු කරයි. (ල.02)

ii.

බිත්තර සඳහා සාමාන්‍ය ඉල්ලුම් සැපයුම් තත්ත්වයක් යටතේ උපරිම මිලක් පැනවූ විට එය සඵල උපරිම මිලක් නම් පාරිභෝගික අතිරික්තය වැඩිවන අතර නිෂ්පාදන අතිරික්තය අඩුවේ. නමුත් මේ තීරණය වන්නේ ඉල්ලුම් සැපයුම් නම්‍යතාවය මතය. උපරිම මිල සඵල නොවන විට,

-අධි ඉල්ලුමක් හෙවත් භාණ්ඩ ඌනයක් පැන නගින බැවින් පාලන මිලට වැඩි මිලට භාණ්ඩ අලෙවි කරන කළුකඩ පැන නැගීමේ ප්‍රවණතාවයක් පවතී.

- මිල නොවන මාධ්‍ය ඔස්සේ සලාක යාන්ත්‍රණයක් බිහිවේ . සීමිත භාණ්ඩ ප්‍රමාණයක් කවර පාරිභෝගිකයන්ට ලබා දෙනවාද යන්න දිගු පෝලිම ඔස්සේ හෝ කල් තබා වෙන්කරවා ගැනීමට සිදුවේ .-හිඟ භාණ්ඩ සොයා යාමේ පිරිවැය - කාලය මුදල් වැය වේ.

- නිෂ්පාදන අතිරික්තය පහළ වැටේ. පාරිභෝගික අතිරික්තය ඉහළ යයි

-සම්පත් බෙදා වෙන් කිරීම අකාර්යක්ෂම වේ .


-නිෂ්පාදන අයභාරය පහළ වැටේ

- ආර්ථික සවිබලතාවක් නොමැති පුද්ගලයන්ට එම භාණ්ඩ පරිභරණය කිරීමේ හැකියාව ලැබේ
-උපරිම මිල ප්‍රතිපත්තියේ අහිසි ප්‍රතිවිපාක සමනය කිරීම වෙනුවෙන් රජයට පිරිවැයක් දැරීමට සිදුවේ
(ඕනෑම කරුණු 01 බැගින් ලකුණු 04)

iii.


හැකියාව ඇත
එසේ කළ හැකි වන්නේ බද්දේ ප්‍රමාණයෙන්ම මිල ඉහළ යන අවස්ථාවලදීය.

පූර්ණ අනම්‍ය ඉල්ලුම් අවස්ථාවකදී




මෙහි බද්දේ ප්‍රමාණයෙන්ම සැපයුම් වක්‍රයේ වමට විතැන්වේ. වෙළඳපොළ පූර්ණ අනම්‍ය ඉල්ලුම් තත්ත්වයක් නිසා තීරණය වූ මිලට රුපියල්ට 35/- ට මිලදී ගැනීමට සිදුවේ.එමනිසා බදු බර මුළුමනින්ම පාරිභෝගිකයා දරයි.
(නිවැරදි ප්‍රස්ථාරයට ලකුණු 01 -පැහැදිලි කිරීමට ලකුණු 01)

පූර්ණ නම්‍ය සැපයුම් තත්ත්වය




මෙහි බද්දේ ප්‍රමාණයෙන් සැපයුම අඩුවේ. වෙළඳපොළ මිල ඉහළ යන අතර එම මිලට භාණ්ඩ මිලදී ගැනීමට සිදුවන බැවින් මුළු බදු බර පාරිභෝගයට දැරීමට සිදුවේ.
(නිවැරදි ප්‍රස්ථාරයට ලකුණු 01 -පැහැදිලි කිරීමට ලකුණු 01)

iv

බද්දක් පැනවූ පසු නිෂ්පාදකයන්ට ලැබුණු මිල හා රජයේ බදු අයභාරය
Qd = 100 - 4pb (pb-ගැනුම්කරුවන්ගේ මිල)
Qs= -20+8ps ( Ps-සැපයුම්කරුවන්ගේ මිල)
Pb = Ps+ t
100-4(Ps+t)= -20+8Ps
100-4(Ps+3)= 20+8Ps
100-4Ps+12= -20+8Ps

108= 12Ps

නිෂ්පාදනය ලැබුණු මිල- 9=Ps (ල.02)

බදු අයභාරය:

බද්දට පසු අලෙවි කළ ප්‍රමාණය *ඒකක බද්ද

Qs = -20 + 8(9) = 52

බදු අයභාරය = 52 * 3 = 156 (ල.02)

v

- සහතික මිල ක්‍රමයක් හඳුන්වාදීම
- ඌණ පූර්ණ ගෙවීමේ ක්‍රමයක් හඳුන්වාදීම
- නිෂ්පාදන සළාක හෙවත් කෝටා ලබා දී සැපයුම සීමා කිරීම
- ආරක්ෂක තොග රැස් කිරීම හා මුදා හැරීම
- අපනයන සහනාධාර ලබාදීම
- භූමිය වගාව සඳහා යොදා නොගැනීම දිරිමත් කිරීම පිණිස ගෙවීම් කිරීම (ල.04)

4) i

- කර්මාන්ත ශාලාවේ තාක්ෂණය සහ නිෂ්පාදන ධාරිතාවය නොවෙනස්ව තිබියදී විචල්‍යය යෙදවුම් පමණක් වෙනස් කරන විට යෙදවුම් හා නිමවුම් අතර පවතින තාක්ෂණික සම්බන්ධතාවය කෙටිකාලීන නිෂ්පාදන ශ්‍රිතය වේ. (ල.01)
- Q=f(L, K) L- ශ්‍රමය K- ප්‍රාග්ධනය (ල.01)

- නිෂ්පාදන ක්‍රියාවලියට අදාළ සියළුම යෙදවුම් වෙනස් කරන විට යෙදවුම් හා නිමවුම අතර පවතින සම්බන්ධතාවය දිගු කාලීන නිෂ්පාදන ශ්‍රිතයෙන් පෙන්වයි. (ල.01)
- Q=f(v,v1,v2,v3,........vn) (ල.01)
  v=විචල්‍යය යෙදවුම්

ii (a)


- අතීතයේදී දරණ ලද පිරිවැය වර්තමානයේදී ආපසු ලබාගත නොහැකි වේ නම් එය යට කළ පිරිවැය ලෙස හඳුන්වයි. (ල.01)
- උදාහරණයක් ලෙස; ස්ථාවර වත්කම් මිලදී ගැනීමට දරන පිරිවැය
  - නාට්‍ය/ චිත්‍රපට ආදිය නැරඹීමට ලබා ගන්නා ප්‍රවේශපත්‍ර (ල.01)

(b)

- මෙම පිරිවැය දැරූ පසු එහි විකල්ප භාවිත නොමැති නිසා ආවස්ථික පිරිවැය ශූන්‍ය වේ (ල.01)
- එම නිසා කෙටි කාලීන නිෂ්පාදන ක්‍රියාවලිය තුළ අවස්ථික පිරිවැය ගණනය කිරීමට යටකළ පිරිවැය අදාළ කර නොගනී. (ල.01)

iii

- පූර්ණ තරගකාරී ආයතනයකට කෙටි කාලය තුළ ස්ථාවර පිරිවැය නොවැලැක්විය හැකි පිරිවැය සංරචකයකි (ල.01)
- එබැවින් වෙළඳපොළ තුළ රැඳී සිටීම පිළිබඳව තීරණය ගන්නේ විචලය පිරිවැය මතය.එමනිසා මිල මගින් සාමාන්‍ය විචල්‍ය පිරිවැය ආවරණය වේ නම් පමණක් වෙළඳපොළ තුළ රැඳී සිටියි. (P>AVC) (ල.01)
- මිල, භාණ්ඩ ඒකකයක සමාන්‍ය විචල්‍ය පිරිවැයට වඩා අඩුවේ නම් ආයතනය වසා දමයි





(ල.02)

මෙම රූප සටහනේ AVC වක්‍රයේ අවම ලක්‍ෂයට අදාල මිල P1 වේ. මිල ඊටත් වඩා අඩුවේ නම් (P<AVC) අඛණ්ඩව වෙළඳපොළ රැඳී සිටීමට සිදුවන්නේ නම් අලාභය ඉහළ යයි. (ල.01)

iv

- දිගුකාලීන සාමාන්‍ය මුලු පිරිවැය වක්‍ර (LRAC)පැතලි Uඅකුරක හැඩය ගන්නේ "පරිමාණානුකූල ඵල නීතියේ" බලපෑම නිසාය (ල.01)
- එහිදී යෙදවුම් වැඩි කරන ප්‍රතිශතයට වඩා වැඩි ප්‍රතිශතයකින් නිමවුම් වැඩිවීමේදී එනම් වැඩෙන පරිමාණානුකූල ඵල ක්‍රියාත්මක වීමේදී පිරිවැය අඩුවේ.(පරිමාණානුකූල පිරිමැසුම් ඇතිවේ)
- යෙදවුම් වැඩි කරන ප්‍රතිශතයට වඩා අඩු ප්‍රතිශතයකින් නිමවුම් වැඩිවීමේ දී හීනවන පරිමාණානුකූල ඵල ක්‍රියාත්මක වේ. එම නිසා පිරිවැය වැඩිවේ. (පරිමාණානුකූල නොපිරිමැසුම් ඇතිවේ) (ල.01)
- පරිමාණානුකූල පිරිමැසුම් හා නොපිරිමැසුම් ක්‍රියාත්මක ව නොවන විට ස්ථාවර පරිමාණානුකූල ඵල ඇතිවේ. (ල.01)
  එම නිසා දිගුනාලීන සාමාන්‍ය පිරිවැය වක්‍රය වඩාත් පැතලි U අකුරක හැඩය ගනී.




රූප සටහන අත්‍යවශ්‍ය නොවේ. එය ඇසුරින් පැහැදිලි කළ ද ලකුණු ලබා දෙන්න.

v. Q=200 AVC=40 P=50 ATC=60

a) TR= P*Q
=50*200
=10000

TC= ATC*Q
=60*200
=12000

$\pi$= TR -TC

=10000-12000

=-2000

අලාභයකි (ල.02)

b) TFC =AFC*Q AFC=ATC- AVC


=20*200 =60-40

=6000 =20 (ල.01)

c) P > AVC

50 > 40 වේ. එම නිසා මිල මඟින් සාමාන්‍ය විචල්‍ය පිරිවැය ආවරණය වන නිසා වෙළඳපොළ තුළ රැඳී සිටී. තවද මිල මඟින් AFC වලින් හරි අඩක් ආවරණය වේ. එබැවින් මෙම ආයතනය අඛණ්ඩව වෙළඳපළ තුළ රැඳී සිටිය යුතුය. (ල.02)

5) i. සරල ආර්ථිකයක සිටින ප්‍රධාන ආර්ථික කාරක දෙක වන්නේ කුටුම්භ හා ව්‍යාපාරය.




(ල.02)

- කුටුම්භ සතුව නිෂ්පාදන සාධක පවතින අතර ඒවා මූර්ත ප්‍රවාහයක් වේ. එම සාධක ව්‍යාපාර වෙත ලබාදීමෙන් කුටුම්භ බදු කුලී, වැටුප්, පොලී සහ ලාභ යන සාධක ආදායම් උපයයි. එය මූල්‍ය ප්‍රවාහයකි. (ආදායම් ප්‍රවේශය) (ල.01)

- ව්‍යාපාර කුඩුම්බවෙතින් ලබාගත් නිෂ්පාදන සාධක භාවිත යෙන් භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරයි .එය මූර්ත ප්‍රවාහයකි. කුටුම්භ සාධක සැපයීමෙන් උපයා ගත් ආදායමෙන් නැවතත් මෙම භාණ්ඩ හා සේවා මිලදී ගනී.මෙය මූල්‍ය ප්‍රවාහයකි.( වියදම් ප්‍රවේශය) (ල.01)

- මෙම වෘත්තාකාර ප්‍රවාහය මගින් ජාතික ගිණුම්කරණයේ නිමැවුම් ආදායම් හා වියදම් යන ප්‍රවේශ බිහිවේ (ල.01)

ii. සත්‍ය සුනිශ්චිත පාරිභෝජන වියදම

- ඇතැම් අවස්ථාවලදී වියදම්ම දරන ලබන පුද්ගලයා සහ පරිභෝජනය කරනු ලබන පුද්ගලයා එකම අයකු නොවේ (ල.01)
  උදාහරණ රජය විසින් දරනු ලබන සෞඛ්‍ය සේවා වියදම තුළින් රෝගීන්ට ලැබෙන ප්‍රතිලාභය
- මේ අනුව භාණ්ඩ හා සේවා අත්කර ගැනීමට වියදම් දරනු ලබන්නේ කුමන පාර්ශවයක් විසින් ද යන්න කා ගණනය කරන පරිභෝජන වියදම සත්‍ය සුනිශ්චිත පරිභෝජන වියදම වේ (ල.01)

iii.

| නිමැවුම් ප්‍රවේශය | ආදායම් ප්‍රවේශය | වියදම් ප්‍රවේශය |
|---|---|---|
| කෘෂිකාර්මික අංශයේ එකතු කළ අගය 5000<br>කාර්මික අංශය එකතු කළ අගය 3000<br>සේවා අංශයේ එකතු කළ අගය 10000<br>**මූලික මිලට එකතු කළ අගය 18000**<br>එකතු කළා<br>නිෂ්පාදනය මත ශුද්ධ බදු 300 | සේවක ආදායම 9000<br>දළ මෙහෙයුම් අතිරික්තය 5000<br>මිශ්‍ර ආදායම් 3000<br>නිෂ්පාදනය මත ශුද්ධ බදු 1000<br>**මූලික මිලට එකතු කළ අගය (දේශීය ආදායමෙන්) 18000**<br>එකතු කළා<br>නිෂ්පාදිතය මත ශුද්ධ බදු 300 | පෞද්ගලික පරිභෝජනය 8000<br>රජයේ පරිභෝජනය 7500<br>දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය 1500<br>ශුද්ධ අපනයන1300 |
| ද.දේ.නි 18300 | ද.දේ.නි 18300 | ද.දේ.නි 18300 |

(ල.01)

iv.

- Y = E
  සමාහාර සැපයුම = සමාහාර ඉල්ලුම
  Y = C + I +G +Nx (ල.01)

- W = J
  කාන්දුවීම් = විදීම්
  S + T + M = I + G +x (ල.01)

v.

a) Y = E

Y = C + I

Y = 600 +0.8Y +200

Y- 0.8y = 800

$\frac{0.2y}{0.2} = \frac{800}{0.2}$

Y = 4000 (ල.02)

b) $C = 600 + 0.8Y$

$C = 600 + (0.8*4000)$

$C = 3800$ (ල.01)

C ) $S = -600 + 0.2y$

$0 = -600 + 0.2y$

$\frac{-0.2y}{0.2} = \frac{-600}{0.2}$

$Y = 3000$ (ල.01)

6) i.

- පොදු පිළිගැනීම
- පහසුවෙන් හඳුනා ගත හැකි වීම
- පහසුවෙන්ප්‍රවා හනය කළ හැකිවීම
- කුඩා ඒකක වලට බෙදා වෙන් කිරීමේ පහසුව
- කල්පවත්නා බව
- සමජාතීය බව
- අනුකරණය අපහසුවීම
  ඕනෑම කරුණු හතරකට (ල.04)

ii ලාභදායීත්වය හා ද්‍රව ශීලත්වය (ල.01)

- වාණිජ බැංකුවක් සිය වත්කම් ව්‍යුහය සැකසීමේදී ද්‍රවශීලතාව ලාභදායිත්වය යන මේවා අතර තෝරා ගැනීමේ ප්‍රශ්නයට මුහුණ දේ.
- වාණිජ බැංකුවක් ද්‍රවශීල වත්කම් තබා ගත යුත්තේ මහජනතාව නැවත ඉල්ලූ විගස ආපසු දීම සඳහා ඔවුන්ගේ විශ්වාසනීයත්වය තහවුරු කිරීමටය.
- ද්‍රවශීල වත්කම් මගින් වාජ බැංකුවකට ලාභයක් ඉපය නොහැකිය .
- ද්‍රවශීල වත්කම් වැඩිපුර තබා ගැනීමේදී ලාභදායිත්වය අඩුවේ.
- ඒ අනුව මුදල් ශේෂ ලෙස සැලකෙන වාණිජ බැංකු වත්කම් 10% ක් හා වෙනත් ද්‍රවශීලවත්කම් ලෙස සැලකෙන භාණ්ඩාගාර බිල්පත් ආදිය 20% ක් තබා ගනියි. (ල.02)

- ලාභ ලැබීමේ අරමුණින් කටයුතු කරන වාණිජ බැංකුවක් තමන්ගේ වත්කම් ගොනු කළමනාකරණය කිරීමේදී වැඩි අවධානයක් ඒ සඳහා යොමු කරයි.
- ඒ අනුව අත්තිකාරම් හා ආයෝජන ලෙස සැලකෙන වත්කම් හෙවත් ලාභදායී වත්කම් 70% ක් පමණ ක් තබා ගැනීමට කටයුතු කරයි.
- කෙසේ වුවත් වාණිජ බැංකුවක් ද්‍රවශීල වත්කම් වැඩිපුර තබා ගැනීමට උත්සාහ කළහොත් ලාභදායිත්වය අඩුවන අතර ලාභදායී වත්කම් වැඩිපුර ළඟ තබා ගැනීමෙන් විශ්වාසනීයත්වය බිඳ වැටේ. (ල.02)

iii

(a) ආනයන - දේශීය භාණ්ඩ හා සේවාවල මිල ගණන් ඉහළ යාම නිසා දේශීය භාණ්ඩවලට ඇති ඉල්ලුම අඩුය. ආනයන ලාභදායී වේ.

(b) විනිමය අනුපාතය- මෙරට උද්ධමනය හා විදේශවල උද්ධමනය සැසඳිය යුතුය. දේශීය උද්ධමනය හමුවේ විනිමය අනුපාතය ක්ෂය වීමකට ලක්වේ.

(c) ගෙවුම් ශේෂය- දේශීය භාණ්ඩල මිල ගණන් ඉහළය. අපනයන තරගකාරීත්වය අඩුවේ. අපනයන ය අධෛර්යමත් වේ. ගෙවුම් ශේෂ දුෂ්කරතා ඇත.

(d) සේවා වියුක්තිය- අවිධිමත් අංශයේ රැකියා සඳහා යොමුවීමෙන් සේවා වියුක්තිය අඩුවේ (ල.04)

iv (අ)

| | | | |
|---|---|---|---|
| තැන්පතු | 350 | මුදල් සංචිතය | 70 |
| | | භාණ්ඩාගාර බිල්පත් | 130 |
| | | ණය අත්තිකාරම් | 150 |
| | 350 | | 350 |

(ආ) අවශ්‍ය සංචිතය 500*20% =100

පවතින සංචිතය = 70

ඌන සංචිතය = 30

තැන්පතු ගුණකය 1 / 20% = 5

ඌන සංචිතය ගුණකයෙන් වැඩිකර ලැබෙන අගයේ ප්‍රමාණයෙන් තැන්පතු සංකෝචනය කළ යුතුය .එම නිසා මුදල් මැවීමේ/ ණයදීමේ හැකියාවන් නොමැත. තැන්පතු 30*5=150 කින් සංස්කෝචනය කළ යුතුය.

(ඉ) බහුවිධ තැන්පතු සංකෝචනය යනු

බැංකු පද්ධතිය තුළ ඌන සංචිතයක් පවතින විට එම ඌන සංචිතය තැන්පතු ගුණකයෙන් වැඩිකර ලැබෙන අගයෙන් ණය හා තැන්පතු පහත දැමීමේ ක්‍රියාවලියයි. එනම් ඌන සංචිතය වෙක් තැන්පතු ගුණකයක ප්‍රමාණයෙන් මුදල් සැපයුම පහල දැමීමේ ක්‍රියාවලියයි (ල.2)

7) i.

- වෙළඳපළ යාන්ත්‍රණය කාර්යක්ෂමව ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍ය කරන නෛතික පදනම හා සමාජය පරිසරය සම්පාදනය කිරීම
- වෙළඳපොළ අසාර්ථක වීම නිසා පැන නගින සම්පත් බෙදීයාමේ අකාර්යක්ෂමතාව ඉවත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම
- සම්පත් බෙදී යාමේ සාධාරණත්වය තහවුරු කිරීම
- ආර්ථික වෘද්ධිය ඉහළ නැන්වීම
- සාර්ව ආර්ථික ස්ථායිතාව පවත්වාගෙන යාම

ii.

- ආදායම් හා ධනය බෙදීයාමේ විෂමතාවයන් අවම කිරීම
- කාර්යක්ෂමව සම්පත් කළමනාකරණය කිරීම
- අවගුණ භාණ්ඩ පරිභෝජනය අධෛර්යමත් කිරීම
- සමාහාර ඉල්ලුම කෙරෙහි බලපෑම
- සමාහාර සැපයුම කෙරෙහි බලපෑම

iii. පහළ බදු අනුපාතයක් පැවතීමට හේතු

- බදු ව්‍යුහය සංකීර්ණ වීම
- ආන්තික බදු අනුපාතිකය ඉහළ අගයක් ගැනීම
- බදු ගෙවන්නන්ට තම බදු වගකීම පිළිබඳ අවබෝධයක් නොතිබීම
- බදු පැහැර හැරීම පිළිබඳව ඇති සමාජ ආකල්ප
- බදු ක්‍රමයේ සාධාරණත්වය හා සමානාත්මතාව
- බදු පරිපාලනයේ කාර්යක්ෂමතා මට්ටම

බදු ආදායම ඉහල නන්වා ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග

- සරල කිරීම
- ඍජු බදුකරණය හා වක්‍ර බදුකරණය
- බදු නිදහස් කිරීම හා නැවත සලකා බැලීම
- බදු පරිපාලනය

iv. රාජ්‍ය ණය තිරසරභාවය

රාජ්‍ය ණය ආපසු ගෙවීමේ කොන්දේසි නැවත වෙනස් කිරීමෙන් සහ ප්‍රධාන රාජ්‍ය ගැලපීම් සිදුකිරීමේ කිසිදු අවශ්‍යතාවයක් ඇති නොවන පරිදි, රටකට තම වර්තමාන හා අනාගත ණය සේවා කරන වගකීම් සපුරාලීමට ඇති හැකියාව රාජ්‍ය ණය තිරසරභාවය ලෙස අදහස් වේ.

ඉහළ සහ වර්ධනය වන ණය මට්ටමක් පවත්වාගෙන යාම රාජ්‍ය මූල්‍ය හා මූල්‍ය ප්‍රතිපත්තිවල සඵලතාවය අඩු කිරීමට හේතුවිය හැකි බැවින් රාජ්‍ය ණය තිරසර මට්ටමක පවත්වාගෙන යාම වැදගත් වේ

ප්‍රධාන දර්ශකය

දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස

2021 මහ බැංකු වාර්තා අනුව

රාජ්‍ය ණය හා දළ දේශීය නිෂ්පාදිතය අතර අනුපාතය

මධ්‍යම ආණ්ඩුව ලබාගත් ණය ප්‍රමාණය හා දළ දේශීය නිෂ්පාදිතය. අතර අනුපාතය


v. පරිභෝජනයේ ඍණ බාහිරතා

සමාජ ප්‍රතිලාභ ඉක්මවා ගිය පෞද්ගලික ප්‍රතිලාභ සහිත තත්ත්වයක් පරිභෝජනයේ ඍණ බාහිරතා වේ

වෙළඳපොළ ක්‍රියාවලිය තුළ මෙම භාණ්ඩ සමාජයීය වශයෙන් ප්‍රශස්ත මට්ටමට ඉක්මවා ගිය පරිභෝජන තත්ත්වයකි

වෙළඳපොල ක්‍රමය දළ පරිභෝජන තීරණ ගැනීමේදී සැලකිල්ලට ගනුයේ හුදෙක් අදාළ භාණ්ඩ පරිභෝජනය නිසා හටගත් පෞද්ගලික ප්‍රතිලාභ හා පිරිවැය පමණි

එම පදනම මත ගන්නා තීරණ සමාජයීය වශයෙන් අකාර්යක්ෂම වේ



ආන්තික පෞද්ගලික ප්‍රතිලාභ වක්‍රය - MB1

ආන්තික සමාජ ප්‍රතිලාභ වක්‍රය - MB2

සැපයුම් වක්‍රය /පෞද්ගලික ආන්තික පිරිවැය වක්‍රය - S

වෙළඳපළ ප්‍රශස්තය - qp

සමාජයීය ප්‍රශස්තය- qs

සම්පත් අධි පරිභෝජනය- qp-qs

8) i. (අ)

- පූර්ණ සාධක සංචලනය
- ස්ථාවර පරිමාණානුකූල ඵල
- බාහිරතා හට නොගනී
- ප්‍රවාහන පිරිවැය සැලකිල්ලට නොගනී (ල.02)

(ආ)

- තාක්ෂණය වෙනස් වීම
- භාණ්ඩ ප්‍රභේදනය
- පරිමාණානුකූල පිරිමැසුම්
- රාජ්‍ය ප්‍රතිපත්ති

ii . ආරක්ෂණවාදයට පක්ෂව

- ජාතික ආරක්‍ෂාව
- සේවා නියුක්තිය ආරක්‍ෂා කර ගැනීම හා ඉහළනන්වා ගැනීම
- ළදරු කර්මාන්ත ආරක්ෂා කිරීම
- ස්ථායීතාව සඳහා විවිධාංගිකරණය වීමේ අවශ්‍යතාව
- ප්‍රපතනය වැළැක්වීම (ල.04)

iii.

- අපනයන විවිධාංගීකරණය කිරීම
- සාම්ප්‍රදායික අපනයන දිරිමත් කිරීම
- අපනයන ප්‍රවර්ධන කලාප පිහිටුවීම
- විදේශ රටවල් සමග වෙළඳ ගිවිසුම් වලට එළඹීම
- ආනයන ආදේශන කර්මාන්ත වැඩි දියුණු කිරීම
- අත්‍යාවශ්‍ය ආනයන හැර අවශේෂ ආනයන අධෛර්යමත් කිරීම
- අපනයන තරගකාරීත්වය වැඩි කිරීම
- විනිමය ක්ෂයවීමට/ අව ප්‍රමාණයට ඉඩ හැරීම

iv.

(a) ජංගම ගිණුමේ ආනයන හර (-)
මුදල් ගිණුමේ මුදල් තැන්පතු බැර(+)

(b) ජංගම ගිණුමේ ප්‍රාථමික ආදායම් හර(-)
මූල්‍ය ගිණුමේ තැන්පත් ශීර්ෂ බැර(+)

(c) මූල්‍ය ගිණුමේ කලඹ ආයෝජන ණය සුරකුම්පත් බැර (+)
මූල්‍ය ගිණුම තුළ රජයේ මුදල් හා තැන්පතු හර(-)

(d) මූල්‍ය ගිණුම අනෙකුත් ආයෝජන ණය බැර(+)
මූල්‍ය ගිණුමේ මුදල් හා තැන්පතු හර(-)

(e) ජංගම ගිණුම ද්විතීක ආදායම් බැර(+)

මූල්‍ය ගිණුමේ අනෙකුත් ආයෝජන මුදල් හා තැන්පතු හර(-)

(f) යටම ගෙවප් ජංගම ගිණුමේ ප්‍රාථමික ආදායම් බැර(+)

මූල්‍ය ගිණුමේ අනෙකුත් ආයෝජන හර(-)

(09) (I) ආර්ථික වර්ධනයත් සමඟ ''කෘෂි අංශයට'' සාපේක්ෂව ''සේවා අංශය'' ඉහළ වර්ධනයක් අත්කර ගනු ලබන්නේ ඇයි? (ලකුණු 04)

- ආර්ථික වර්ධනය වේගවත් වීමත් සමඟ සේවා සඳහා ඇති ඉල්ලුම් නම්‍යතාවය එකට වැඩි අගයක් ගන්නා බැවින් සේවා අංශයේ වර්ධනය සාපේක්ෂව ඉහළ යයි.
- එසේම සාපේක්ෂව ගත්විට කෘෂි අංශය හා සසඳන කල සේවා අංශය ඉහළ ඵලදායීතාවක් වාර්තා කරයි. මේ හේතුවෙන් සේවා අංශය වර්ධනය ඉහළ යයි.
- තවද සේවා අංශය සඳහා අවශ්‍ය ස්වාභාවික සම්පත් ප්‍රමාණය කෘෂි අංශයට සාපේක්ෂව ඉතා අඩු වේ. මේ හේතුවෙන් සේවා අංශය ඉහළ වර්ධනයක් අත්කර ගනු ලැබේ.

(ඕනෑම කරුණු 02 කට ලකුණු 04 යි.)

(II) 2022 වර්ෂය ලංකාවේ අඩුම ආර්ථික වර්ධන වේගය වූ -7.8% අගයක් වාර්ථාකරන ලදී. මෙසේ ආර්ථික වෘද්ධිය අඩාලවීමට බලපෑ සාධක මොනවාද? (ලකුණු 04)

- දැඩි විදේශ විනිමය හිඟතාවය හේතුවෙන් ඉන්ධන හා විදුලිය වැනි බලශක්ති සහ අනෙකුත කර්මාන්ත සඳහා අවශ්‍ය යෙදවුම් වල උග්‍ර හිඟයන් හේතුවෙන් කර්මාන්තවල නිෂ්පාදන කටයුතු අඩාල වීම.
- උද්ධමනය පාලනය කිරීමට මහ බැංකුව ප්‍රතිපත්තිමය පොළී අනුපාත ඉහළ නැංවීම නිසා සමස්ත පොළී අනුපාත ඉහළ යාම හේතුවෙන් ආයෝජන පහත වැටීම.
- ආර්ථිකයේ ඇති වූ අයහපත් ක්‍රියාකාරීත්වය හේතුවෙන් කර්මාන්ත, සේවා හා කෘෂිකර්මාන්ත යන ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් ත්‍රිත්වයම ක්‍රියාකාරීත්වය පහත වැටීම.
- දේපළ වෙළෙඳාම්, නිවාස අයිතිය, රක්ෂණ සේවා හා මූල්‍ය සේවා ආදිය පසුගාමීක්වය නිසා සමස්ත සේවා කටයුතු පහත වැටීම.
- පොහොර අර්බුදය නිසා වී සහ එළවළු වගා කටයුතුවලට බාධා සිදුවීම නිසා සමස්ත කෘෂිකාර්මික කටයුතු පහත වැටීම.

(කරුණු 01 කට ලකුණු 01 බැගින් මුළු ලකුණු 04 යි.)

(III) මානව සංවර්ධනය අර්ථ දක්වන්න. මානව සංවර්ධනයේ යහපත් ලක්ෂණ මොනවාද? (ලකුණු 04)

සියලු මිනිස් ජීවිතවල ආර්ථික තත්ත්වය හා ගුණාත්මක තත්ත්වය ඉහළ නැංවීමේ ක්‍රියාවලියයි. එනම් මානව සංවර්ධන ක්‍රියාවලියයි. මිනිසුන්ගේ ජීවන තත්ත්වය උසස් වීමත් සමඟ ආත්ම අභිමානය වර්ධනය කර ගැනීමට හිතකර වූ දේශපාලන සමාජ හා ආර්ථික පරිසරයක් ගොඩනගා ගැනීම සංවර්ධනයේදී ඉතා වැදගත් වේ. (ලකුණු 02)

මානව සංවර්ධනයේ යහපත් ලක්ෂණ

(1) තෝරා ගැනීමේ නිදහස
(2) ආරක්ෂාව
(3) යහපත් ජීවිතයකට අවශ්‍ය දෑ
(4) යහපත් සෞඛ්‍ය පුරුදු
(5)යහපත් සමාජ සම්බන්ධතා (ලකුණු 02)

(IV) මානව සංවර්ධනය වඩා පරිපූර්ණ ලෙස විග්‍රහ කිරීම සඳහා කුමන ක්ෂේත්‍රයක් කෙරෙහි සැලකිල්ලට ගත යුතුද? (ලකුණු 04)

1. මානසික නිරෝගීභාවය
2. සවිබල ගැන්වීම
3. දේශපාලන ස්වාධීන බව
4. යහපත් සමාජ සම්බන්ධතා
5. සමානත්වය
6. වැඩ කරන පරිසරය
7. විවේක ගැනීම් පහසුකම්
8. ආර්ථික නිදහස

(කරුණු 01 කට ලකුණු 01 බැගින් මුළු ලකුණු 04 යි.)

(V) ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය කෙරෙහි බලපාන සාධක ප්‍රධාන ශීර්ෂ යටතේ පැහැදිලි කරන්න (ලකුණු 04)

- ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව කෙරෙහි බලපා ඇති සාධක ප්‍රධාන ශීර්ෂ තුනක් යටතේ වර්ග කළ හැකිය. ඒවා නම්

1. අවකාශීය හෝ ස්ථානීය කේන්ද්‍රීය කරුණු
2. ආංශීක ලක්ෂණ
3. පුද්ගල බද්ධ හා කුටුම්බ බද්ධ සාධක (ලකුණු 02)

- දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටම් වල ක්‍රියාත්මක වන අවකාශීය ලක්ෂණ දරිද්‍රතාව සමඟ ප්‍රබල සහසම්බන්ධතාවක් පෙන්නුම් කරයි. අන් සියලුම ලක්ෂණ වලින් එක හා සමාන වන ගෘහ කුටුමබයක් එය පිහිටා ඇති ස්ථානය අනුව දරිද්‍රතාව මට්ටම පිළිබඳ වෙනස් ප්‍රවණතාවක් පෙන්නුම් කළ හැකිය.

උදා:- ශ්‍රී ලංකාවේ නාගරික හා වතු ප්‍රදේශ අතර දරිද්‍රතා පරතරය.

- ආර්ථිකයේ විවිධ අංශවල පවතින පසුගාමී තත්ත්වයන් දරිද්‍රතාව කෙරෙහි බලපායි. උදාහරණ ලෙස කෘෂි
අංශයේ මන්දගාමී වර්ධණය දරිද්‍රතාව කෙරෙහි බලපානු ලබයි. එනම් කෘෂිකර්මය මත යැපෙන කුටුම්බ වල
දරිද්‍රතාව ඉහළ මට්ටමක පවතී. ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව පිළිබඳ ගැටළුව මූලික වශයෙන් ග්‍රාමීය ප්‍රපංචයක් ලෙස පවතී.
- එසේම දරුවන් වැඩි වශයෙන් සිටින විශාල පවුල් දිළිඳු වීමට වැඩි ප්‍රවණතාවක් දක්වයි. අඩු අධ්‍යාපනයට
යොමු වීමද ප්‍රබල ලෙස දරිද්‍රතාවයට බලපායි. ඒ අනුව පුද්ගල බද්ධ හා කුටුම්බ බද්ධ බව ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව හා බැඳී පවතී. (ලකුණු 10)

(I) ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රාග්ධන හිඟයට වඩාත්ම සුදුසු මූලාශ්‍රය වන්නේ විදේශ ආයෝජන ආකර්ශණය කරගැනීම වේ. ශ්‍රී ලංකාව වර්තමානයේ මුහුණදෙන අභියෝග දක්වමින් ඉහත ප්‍රකාශයේ වලංගුභාවය පරීක්ෂා කරන්න.

(ලකුණු 05)

- ශ්‍රී ලංකාවේ ජංගම හා ප්‍රාග්ධන ගිනුම් හිඟය, දේශීය ඉතුරුම් හා ආයෝජන පරතරය හා අයවැය හිඟය පියවා ගැනීමට විදේශ ප්‍රාග්ධන අත්‍යවශ්‍ය සාධකයක් වේ. විදේශ ප්‍රාග්ධනය ශ්‍රී ලංකාවට ලැබෙන මූලාශ්‍ර කිහිපයක් ඇත. විදේශ ප්‍රදාන, විදේශ ණය හා ආධාර සහ විදේශ ආයෝජන ඒවා වේ.

- මෑත කාලයේ දිගින් දිගටම ශ්‍රී ලංකාවට විදේශ ප්‍රාග්ධනය ලැබෙන ප්‍රධාන මූලාශ්‍ර වූයේ විදේශ ණය හා විදේශාධාර වේ. එහෙත් විදේශ ණය හා ආධාර මගින් තවදුරටත් විදේශ ප්‍රාග්ධනය ලබා ගැනීම ගැටලු හා දුෂ්කරතා රැසක් ජනිත කර ඇත.

- විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය බර, රටක් ලෙස ශ්‍රී ලංකාවට දරාගත නොහැකි මට්ටමට ළඟා වී ඇත. විදේශ ණය සේවාකරණය සඳහා විශාල සම්පත් ප්‍රමාණයක් වාර්ෂිකව රටින් පිටතට ඇඳයාම යන කරුණු ශ්‍රී ලංකාවට මහත් අභියෝගයක් වී ඇත. මෙම තත්ත්වය රාජ්‍ය අයවැය ලේඛනයට අහිතකර ලෙස බලපාන අතරම, විදේශ ණය ගෙවීමේදී විදේශ විනිමය සඳහා වන ඉල්ලුම වැඩිවීම බාහිර අංශයේ සමතුලිතතාවයට බාධා එල්ල කර ඇත.

- මෙවැනි අභියෝග හමුවේ වුවද ඉතා කුඩා ආර්ථිකයට හිමිකම් තිබෙන හා දියුණු වෙමින් පවතින රටක් ලෙස විදේශ ප්‍රාග්ධනය ඉතා අත්‍යවශ්‍ය ලෙස ඉස්මතු වී පවතී. ඒ අනුව විදේශ ආයෝජන ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රාග්ධන සම්පාදනයෙහිලා වඩාත් විශ්වාසදායි හා තිරසාර මූලාශ ලෙස ඉස්මතු ව ඇත.

- විදේශ ප්‍රාග්ධන හිඟය පියවීම පමණක් නොව තාක්ෂණය පරතරය, පුහුණු ශ්‍රමය ආකර්ෂණය කර ගැනීම, අති නවීන කළමනාකරණ ශිල්ප ක්‍රම හඳුන්වාදීම දීම, ඵලදායීතා පරතරය පියවීම, තොරතුරු පරතරය පියවා ගැනීම, වෙළෙඳපොළ පරතරය පියවීම, අපනයන වෙළෙඳපොළ ජය ගැනීම, යටිතල පහසුකම් දියුණු කරගැනීම වැනි අභියෝග බොහෝමයකට විදේශ ආයෝජන වඩාත් තිරසාර විසඳුමක් ගෙන දෙනු ඇත.

- විදේශ ආයෝජන රටකට ලබාගත හැකි ක්‍රම දෙකක් ඇත. ඒවා නම් සෘජු විදේශ ආයෝජන හා මුදල් වෙළෙඳපොළ හරහා සිදුවන කළඹ ආයෝජන වේ. ඒ අතරින් කළඹ ආයෝජන අස්ථාවර හා කෙටි කාලීන අරමුණු පෙරදැරිව සිදුවන බැවින් විදේශ සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම වඩාත් සුදුසු හා තිරසාර මූලාශ්‍රය වේ.

(කරුණු 01 කට ලකුණු 01 බැගින් මුළු ලකුණු 05 යි.)

(II) ස්ථාවර ජාතික සංවර්ධන ප්‍රතිපත්තියක අවශ්‍යතාවය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

සංවර්ධනය වෙත නැඹුරු වූ ස්ථාවර ජාතික ප්‍රතිපත්තියක් පැවතීම දියුණු හා නැගී එන ආර්ථිකයන් හට විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම හා ජාත්‍යන්තර වෙළඳාමෙන් සැලකිය යුතු කොටසක් අත්කර ගැනීම හරහා වෙළෙඳපොළ තුළ සාර්ථකව තරග කිරීමේ හැකියාව ලැබෙනු ඇත.

බලයට පත්වන රජයක් ඒ ඒ කාල වකවානු වල තම තමන්ගේ න්‍යායපත්‍ර වලට අනුව ක්‍රියාත්මක වීම නිසා වෙළෙඳපොළ අවධානම ඉහළ නංවන අතර එමගින් ආයෝජකයන්ගේ විශ්වාසය පළුදු වේ.

මේ නිසා කලින් කලට වෙනස් නොවන ජාතික සංවර්ධන ප්‍රතිපත්තියක් රටකට අත්‍යවශ්‍ය වේ. එමගින් කඩින් කඩ ක්‍රියාත්මක වුණු එක් එක් රජයන්ගේ ප්‍රතිපත්ති වලින් බිඳවැටුණු ආයෝජනය විශ්වාසය යළි ගොඩනැගිය හැකි වනු ඇත.

(කරුණු 01 කට ලකුණු 02 බැගින් උපරිම ලකුණු 05 යි.)

(III) නිදහසින් පසු ශ්‍රී ලංකා ආර්ථිකයේ ගමන් මග ආර්ථික ලක්ෂණවලට අනුව අවධි 5කි. එම අවධි 5 දක්වන්න.

(ලකුණු 05)

1. 1948 - 1960 දක්වා අවධිය
2. 1961 - 1977 දක්වා අවධිය
3. 1978 - 1994 දක්වා අවධිය
4. 1995 - 2014 දක්වා අවධිය
5. 2015 - 2019 දක්වා අවධිය

(කරුණු 01 කට ලකුණු 01 බැගින් මුළු ලකුණු 05 යි.)

(IV) රාජ්‍ය මූල්‍ය අවකාශය යන්නෙන් කුමක් අදහස්වේද? ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය අවකාශය අහිමිවීම ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි ඇති කරන අයහපත් බලපෑම විස්තර කරන්න.

(ලකුණු 05)

- රාජ්‍ය මූල්‍ය අවකාශය යන්නෙන් අදහස් කරන්නේ රාජ්‍ය මූල්‍ය තත්ත්වයේ තිරසාරභාවයට හෝ ආර්ථික ස්ථායීතාවයට බලපෑමක් ඇති නොවන පරිදි රජය සතු සම්පත් රජයේ අපේක්ෂිත අවශ්‍යතා සඳහා බෙදා හැරීමට අයවැය තුළ ඇති ඉඩකඩ වේ.

(ලකුණු 03)

- ශ්‍රී ලංකාවේ මෑත කාලයේ රාජ්‍ය මූල්‍ය අවකාශය අවම මට්ටමක පවතී. රාජ්‍ය වියදම් සංයුතිය දැඩි අනම්‍ය ස්වභාවයක් ගැනීම හා එය වර්ධනය වීම, රාජ්‍ය අයභාරය සෙමින් වර්ධනය වීම, ණය ලබාගැනීමේ නැඹියාව ඉහළ යාම හා ආර්ථික වර්ධනය පහළ මට්ටමක පැවතීම යන හේතු මේ සඳහා බලපා ඇත.

(ලකුණු 01)

- මෙම තත්ත්වය තුළ ශ්‍රී ලංකාවට ඉතා අවාසිදායක වටපිටාවක් නිර්මාණය කර ඇත. විශේෂයෙන්ම සංවර්ධන ක්‍රියාවලියට අත්‍යවශ්‍ය ප්‍රාග්ධන වියදම් හා අධ්‍යාපනය, සෞඛ්‍ය හා සුභසාධනය වැනි අත්‍යවශ්‍ය සේවා රජයේ අභිමතය පරිදි ඉහළ නංවා ගැනීමට නොහැකිවීම මේ තත්ත්වයට බෙහෙවින් බලපා ඇත.

(ලකුණු 01)